# ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මැඬලීමට නීති ප්‍රතිසංස්කරණ

1 වන කොටස

## පවත්නා නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 නොවැම්බර්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන: +9411 2081384, +94112081385, +94112081386
ෆැක්ස්: +9411 2081388
වෙබ්: www.cpalanka.org
ඊමේල්: info@cpalanka.org
ෆේස්බුක්: www.facebook.com/cpasl
ට්විටර්: @cpasl

# පිළිගැනීම

මෙම වාර්තාව ක්‍යාති වික්‍රමනායක විසින් ඉන්ෂිරා ෆලික්ගේ සහාය ඇතිව පර්යේෂණය කර ලියා ඇත. මෙම වාර්තාවෙහි මූලික කෙටුම්පත් සම්බන්ධයෙන් අදහස් ආචාර්ය පාකියසෝති සරවනමුත්තු, භවානි ෆොන්සේකා සහ නිවේදා ජයසීලන් විසින් සපයන ලදි. වාර්තාව සංස්කරණය කරන ලද්දේ පසන් ජයසිංහ විසින් වන අතර පිටු සැකසුම අයුධ්‍යා ගජනායක විසින් කරන ලදි. මෙම වාර්තාව සැකසීමේ දී චූලනී කොඩිකාර විසින් තොරතුරු සහ දැනුම තුළින් ලබා දුන් සහාය වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ස්වකීය කෘතඥතාවය පළකර සිටී.

# පටුන

පිළිගැනීම....2
පටුන....3
හැඳින්වීම....4
1. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු සහගත නීති....6
ස්ත්‍රී දූෂණය....6
වෛවාහක ස්ත්‍රී දූෂණය....8
ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය....8
ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සඳහා අවම අනිවාර්ය දඬුවම....9
ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය....11
ගෘහස්ථ හිංසනය පිළිබඳ නිර්වචනය....12
ගෘහස්ථ හිංසනය පිළිබඳ සාපරාධී වරදක් හඳුන්වා දී නොමැත....14
අධිකරණයන්ට ප්‍රවේශවීමේ සීමාවන්....15
පනත බලාත්මක කිරීමේ ගැටළු....15
ගබ්සාව....16
2. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට ප්‍රතිචාර නොදක්වන අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියක්....20
නඩු කටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් වන දීර්ඝ කාලීන ප්‍රමාදයන්....20
වින්දිතයා සහ සාක්ෂිකරුවා ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රමවේදයක් නොපැවතීම....22
ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයෙහි වින්දිතයින් සඳහා වන අධිකරණ සහභාගීත්ව රීතීන්හි ප්‍රමාණවත් නොවන බව සහ පරස්පරතාවය....23
නොගැලපෙන දඬුවම් පිළිබඳ මාර්ගෝපදේශයන්....24
ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනයට පාත්‍රවන වින්දිතයින්ගේ නම් වාර්තා වීම....25
ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනයට ගොදුරු වූවන් සඳහා ප්‍රමාණවත් 'එක්-නැවතුම් මධ්‍යස්ථාන' නොමැති වීම....26
පැමිණිලි කිරීමේ දුෂ්කරතා....29
3. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආශ්‍රිත නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ මන්දගාමී වීමට බලපාන සාධක....30
ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය ආශ්‍රිත ගැටළු විසඳීමට දේශපාලන අභිප්‍රායක් නොමැති වීම....30
පාර්ලිමේන්තුවේ දුර්වල කාන්තා නියෝජනය....31
විධායකය තුළ කාන්තාවන්ගේ ගැටළු සඳහා ලබා දී ඇති අවම ප්‍රමුඛතාවය....33
ඍණාත්මක සමාජ ආකල්ප සහ කාන්තාවන් කෙරෙහි ඇති අපකීර්තිය....35
4. නිර්දේශ....37
ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය හා සම්බන්ධ පවත්නා නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ....37
අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය වඩාත් වින්දිත කේන්ද්‍රීය බවට පත් කිරීම සඳහා නිර්දේශ....38
ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය ඇතිවීම අවම කිරීම සඳහා නිර්දේශ....41

## හැඳින්වීම

ගෝඨාභය රාජපක්ෂ විසින් ස්වකීය ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරන ලද්දේ 'අපගේ රටේ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ඉහළ ගොස් ඇති බවයි'.[1] කෙසේ නමුත්, ඔහු බලයේ සිටි පළමු වසර තුළ මෙම ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සම්බන්ධයෙන් ඉතාම අවම වශයෙන් ක්‍රියාකර තිබීම පමණක් දැකිය හැකිය. මෙය ශ්‍රී ලංකාව තුළ වරින් වර බලයට පත් ආණ්ඩු ගණනාවක් සම්බන්ධයෙන්ම එක හා සමානව පවතින ප්‍රවණතාවයකි.

රාජ්‍යයේ කාර්යභාරය වූ කලී නීති පොත් යාවත්කාලීන කිරීමෙන් පමණක් අවසන් නොවේ. සැබවින්ම යුක්තිය ඉටු වන අයුරින් මෙම වැරදි සිදුකරන අයට එරෙහිව නඩු පැවරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය තුළ සිටින පොලිසිය සහ වෛද්‍ය වෘත්තිකයන්, නඩු පවරන්නන් සහ විනිසුරුවන් වැනි නිලධරයන්ගේ කැපවීම අවශ්‍ය වේ.

මෙරට තුළ සිදුවන ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (Sexual and Gender Based Violence-SGBV) සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා වර්තමානයෙහි ක්‍රියාත්මක වන නීති කිහිපයක් පැවතියද ඒවා ප්‍රමාණවත් නොවන බව විද්‍යමාන වන අතර, එලෙස පවතින සීමිත නෛතික විධිවිධානයන් භාවිතා කිරීමෙන් පවා මේ සම්බන්ධයෙන් නඩු පැවරීම් යම් තරමක් දුරට සිදු වේ. නිදසුනක් වශයෙන්, වර්ෂ 2019 දී ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී දූෂණ සිදුවීම් 1,779 ක් වාර්තා වී ඇති අතර, එම වැරදි සම්බන්ධයෙන් ගොනු කර ඇති පැමිණිලි (සහ/හෝ අධිචෝදනා) සංඛ්‍යාව 235 ක් පමණි.[2] රජයක වගකීම වන්නේ හුදෙක් නීති සම්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පමණක් නොවන අතර අපාරාධ යුක්තිය පසිඳලීමේ සමස්ත යාන්ත්‍රණයයෙහි සාර්ථකත්වය සහතික කිරීම සඳහා ඊට අදාල සියලු ව්‍යුහයන්හි කාර්ය කර්තව්‍යයන් සුමටව ක්‍රියාත්මක වන බව සහතික කිරීමට ද පියවර ගත යුතුය.

මීට අමතරව, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට අදාල ක්‍රියාවන්ට එරෙහිව නඩු පැවරීම සහතික කිරීම සඳහා රජයෙහි කාර්යභාරයට අමතරව, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම අරමුණු කරගත් පද්ධති සහ වැඩසටහන් ද ස්ථාපිත කර ඒවා සක්‍රීයව ක්‍රියාත්මක කළ යුතුය. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් කිසිදු බියකින් සැකයකින් තොරව කාන්තාවන්ට ඔවුන්ගේ දෛනික ජීවිතයෙහි කටයුතු භුක්ති විඳීමේ නිදහස තිබිය යුතු අතර, එසේ කළ හැකි වන්නේ මෙම වැරදිවලට හේතු පාදක වන සාධක ආමන්ත්‍රණය කිරීමෙන් පමණි. සියලු පුරවැසියන්ගේ නිදහස සහතික කෙරෙන සාධාරණ සමාජයක් පැවතිය හැක්කේ මෙවන් තත්වයක් ස්ථාපිත වූ විට පමණි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම ලිපි මාලාව ඔස්සේ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් වන ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා අවැසි නෛතික හා

---

[1] 'සමෘද්ධිය හා තේජස පිළිබඳ දර්ශන', ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රකාශනය, 2019, 27 වන පිටුව, https://gota.lk/sri-lanka-podujana-peramuna-manifesto-english.pdf

[2] ශ්‍රී ලංකා පොලිසිය, '2011.01.01 සිට 2011.12.31 දක්වා මුළු දිවයින සඳහාම 2019 වර්ෂය සඳහා බරපතල අපරාධ සාරාංශය' https://www.police.lk/images/crime_ststistics/2019/Grave-crime-abstract-for-the-Year-2019.pdf

ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසනු ලබයි. ශ්‍රී ලංකාව තුළ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් වන ගැටළු අවම කිරීම සඳහා අවශ්‍ය පුළුල් වෙනස්කම් සිදු කිරීම සම්බන්ධයෙන් නෛතික ප්‍රතිසංස්කරණ පමණක් ප්‍රමාණවත් නොවන බව මෙහිලා මූලික වශයෙන්ම සඳහන් කළ යුතුය. මෙරට තුළ දැනට ඉහළ මට්ටමක පවතින ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධ ක්‍රියාවන් සහ එවැනි වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කටයුතු මන්දගාමී වීමට හේතු වන එකම සාධකය පවතින නීතිමය සහ ප්‍රතිපත්තිමය තත්වයන් නොවේ. මෙහිදී, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් වන නෛතික ප්‍රතිසංස්කරණ වූ කලී එකී ප්‍රශ්නයට අදාල මූලික හේතු සාධක ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සමඟ එකිනෙක හා බැඳී පැවතිය යුතුවේ. නව නීතිමය විධිවිධාන හඳුන්වාදීම නම් වූ තත්වයෙන් ඔබ්බට ගිය එවැනි ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ද මෙම ලිපි මාලාව ඔස්සේ විමසා බලා අදාල නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ.

මෙම ලිපි මාලාවේ පළමු ලිපිය ඔස්සේ ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධව පවත්නා නීති සහ ප්‍රතිපත්ති පිළිබඳව විමසා බලනු ලබයි. එය කොටස් හතරකින් සමන්විත වේ. පළමු කොටස ඔස්සේ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ දැනට පවතින ගැටළු සහගත නීති කිහිපයක් සම්බන්ධයෙන් විමසා බලනු ලබන අතර කඩිනම් ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය වන අංශ ත්‍රිත්වයක් ඔස්සේ: එනම්, ස්ත්‍රී දූෂණය, ගෘහස්ථ හිංසනය සහ ගබ්සාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආශ්‍රිත නීති තත්වයන් පුළුල්ව විස්තර කරනු ලබයි. දෙවන කොටස තුළින් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්වය පද්ධතිය පුළුල් ලෙස විමර්ශනය කරනු ලබන අතර එමඟින් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙහි වින්දිතයින්ට විශේෂයෙන් ප්‍රතිචාර නොදක්වන්නේ මන්ද යන්නට හේතු ගණනාවක් හඳුනා ගනී. තෙවන කොටස ඔස්සේ ශ්‍රී ලංකික සමාජය පිළිබඳ පොදු නිරීක්ෂණයන් කෙරේ අවධානය යොමු කරනු ලබන අතර ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආශ්‍රිත නෛතික හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල ප්‍රගතියට බාධාවක් වන සමාජ-දේශපාලන සාධක ගණනාවක් හඳුනා ගනී. ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධ නෛතික සහ ප්‍රතිපත්තිමය වශයෙන් වඩාත් සාධනීය ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා නීති සම්පාදකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නීතිය, අපරාධ යුක්ති විනිශ්වය පද්ධතිය සහ සමාජය යන අංශවල පාර්ශ්වකරුවන් වෙනුවෙන් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරන සිව්වන කොටස සමඟින් මෙම වාර්තාව අවසන් වේ.

මෙම වාර්තාව ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන ක්ෂේත්‍ර පිළිබඳ පූර්ණ සවිස්තරාත්මක අධ්‍යයනයක් නොවන බවත් එය වූ කලී එකී විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මේ වන තෙක් සමාජ ක්‍රියාකාරීන් සහ විද්වතුන් විසින් සිදුකර ඇති මෙහෙය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා දායකත්වය සැපයීමක් බවත් සැලකිල්ලට ගත යුතුය. [3]

---

[3] හිංසනය වැළැක්වීම පිළිබඳ විපක්ෂ නායකයා විසින් පත්කළ කොමිෂන් සභාවේ සහ ගැහැණු ළමයින්ගේ වාර්තාවේ අඩංගු නිර්දේශ බලන්න. 2014 දෙසැම්බර් මාසය.
http://gbvforum.lk/rlibrary/document/Report%20of%20the%20Leader.pdf

# 1. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු සහගත නීති

ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ පවත්නා නීති ගැටළු සහගත වන අතර ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන අංශ ත්‍රිත්වයක් වනඃ ස්ත්‍රී දූෂණය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ ගබ්සාව සම්බන්ධයෙන් මෙම කොටසින් විමසා බලනු ලබයි. මෙකී ක්ෂේත්‍ර මඟින් කිසිසේත් ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආශ්‍රිත නීති සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණයන් අවශ්‍ය කෙරෙන්නා වූ සියලුම ක්ෂේත්‍ර ආවරණය නොකෙරෙන නමුදු, ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අවශ්‍ය නීති හා නීති ප්‍රතිසංස්කරණ හා බැඳි ගැටළු වල ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ලැබේ.

ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් කාර්ය පටිපාටික හා හරයාත්මක නීති ප්‍රතිසංස්කරණයන් උදෙසා වසර ගණනාවක් පුරාවට බොහෝ ඉල්ලීම් සිදු කරනු ලැබ තිබේ. මේ සම්බන්ධයෙන් අවැසි ප්‍රතිසංස්කරණයන්හි අඛණ්ඩ හිඟයක් පැවතීම තුළ, මේ සඳහා පවතින නීතිය ප්‍රමාණවත් නොවන තත්වය එලෙසම පවතී. දණ්ඩ නීති සංග්‍රහයේ ලිංගික අපරාධ සම්බන්ධයෙන් අවසාන වශයෙන් වැදගත් සංශෝධනයන් ඇති කරන ලද්දේ වර්ෂ 1998 සහ 1995 දී හඳුන්වා දෙන ලද (වර්ෂ 2006 දී තවත් සුළු සංශෝධන කිහිපයක් සමඟ) නෛතික විධිවිධාන ඔස්සේය. වර්ෂ 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත සම්මත වී වසර 15 ක් ගත වී ඇති අතර අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් සඳහා කවර අන්දමේ ඉල්ලීම් කළද තවමත් ඒ කිසිවක් නීතිගත කර නොමැත.

## ස්ත්‍රී දූෂණය

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණය පිළිබඳ නීතිමය තත්වය දණ්ඩ නීති සංග්‍රහයේ දක්නට ලැබෙන අතර,[4] ස්ත්‍රී දූෂණය පිළිබඳ වගන්තීන් විවිධාකාර සංශෝධන වලට ලක්ව ඇත. වර්තමානයේ පවතින නීතිමය තත්වය ප්‍රකාරව ගත්කල, 363 වන වගන්තියේ (අ) සිට (ඈ) දක්වා උපවගන්තිවල දක්වා ඇති ඕනෑම තත්වයක් යටතේ ඕනෑම අවස්ථාවකට අයත්වන පරිවේෂණ යටතේ ස්ත්‍රියක් සමඟ මෛථුනයෙහි යෙදේ නම් ඔහු ''ස්ත්‍රී දූෂණය'' සිදු කලේ යයි කියනු ලැබේ.[5]

පහත සඳහන් කරුණු හේතුවෙන් එය පුළුල් ලෙස විවේචනයට භාජනය වී ඇතඃ

a) මෙම වගන්තියට අනුව, ස්ත්‍රී දූෂණය කිරීමේ වරද කළ හැක්කේ පිරිමියෙකුට පමණක් වන අතර, එහි වින්දිතයා බවට පත්විය හැක්කේ කාන්තාවකට පමණි.[6] මෙහිදී ස්ත්‍රීන් ද අපරාධකරුවන් විය හැකි අතර ස්ත්‍රී දූෂණයට ගොදුරු වී වින්දිතයන් බවට පිරිමින් ද පත්විය

---

[4] 363 සහ 364 වගන්ති, දණ්ඩ නීති සංග්‍රහය

[5] "ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණය පිළිබඳ නෛතික අර්ථ දැක්වීම ඉතා පටුය", *2016 නොවැම්බරයේ ජාත්‍යන්තර කවුල්ඩුන්,* ලබා ගත හැකි පියුමනී රණසිංහ. http://intca.org/2016/11/fixing-lka-definition-rape/

[6] ඒ. ඒ. එදිරිසිංහ සහ එන් කේ. කේ. මුදලිගේ, 'ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණයට පුරුෂ යන් වින්දිතයන් වීම - සිද්ධි අධ්‍යනය', APIIT ව්‍යාපාර, නීති හා තාක්ෂණ සමුළුවේ ක්‍රියා පටිපාටි, ආසියා පැසිෆික් තොරතුරු තාක්ෂණ ආයතනය, 2017 https://www.conference.apiit.lk/pdf2/Law/LBAT201714.pdf

හැකි බව නීතිය පිළිගනු ලබන්නේ නැත. වාර්ෂිකව පුරුෂයින් සැලකිය යුතු සංඛ්‍යාවක් දූෂණයට ගොදුරු වන බවට වාර්තා වේ.[7]

b) ස්ත්‍රී දූෂණය යෝනි මාර්ගය වෙත ශිෂ්ණය ප්‍රවේශනය වීමට පමණක් සීමා වේ. කැමැත්තකින් තොරව ස්ත්‍රීන් හා පුරුෂයන් අතර මුඛය හෝ ගුදය වෙත ප්‍රවේශනය වීමේ ක්‍රියාවන් මෙම වගන්තියෙහි විෂය පථයට අයත් නොවේ. මෙම විධිවිධානය මගින් සමලිංගික පුද්ගලයන් අතර එකඟත්වයකින් තොරව සිදුවන ලිංගික ක්‍රියාවන් ආවරණය නොකරන අතර සංක්‍රාන්ති ලිංගිකයින් සම්බන්ධයෙන් ඇති අදාලත්වය අපැහැදිලි තත්වයක පවතීය. එවැනි සියලු ක්‍රියාවන් බරපතල ලිංගික අපයෝජනයකට පමණක් සීමා වන අතර (වර්ෂ 1995 දී හඳුන්වා දුන් පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ 365 ආ වගන්තිය) එමගින් යෝනි මාර්ගය තුළට ශිෂේණය ප්‍රවේශනය සංස්ථාපනය නොවන අනෙකුත් සියලුම ලිංගික අපයෝජන හෝ ලිංගික හිංසනය පිළිබඳ සිද්ධීන් ආවරණය වේ. ස්ත්‍රී දූෂණය පිළිබඳ විධිවිධාන මගින් ලබා දී ඇති ආරක්ෂාවෙන් බොහෝ තැනැත්තන් බැහැර කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය උල්ලංඝණය වීම සංස්ථාපනය වීමටද හේතු වේ.

c) වර්ෂ 1995 සංශෝධනය අනුව, 363 වගන්තියට පැහැදිලි කිරීමක් හඳුන්වා දෙන ලද අතර, එමගින් පැහැදිලි කෙරෙනුයේ *'ශරීරයට සිදු වී ඇති ශාරීරික තුවාළ වැනි ප්‍රතිරෝධය පෑම පිළිබඳ සාක්ෂි මෛථුනය සිදු කර ඇත්තේ කැමැත්ත නොමැතිව බව ඔප්පු කිරීමට අත්‍යවශ්‍ය නොවේ.'* කෙසේ නමුත්, බොහෝ විට තවමත් අධිකරණයෙහි ස්ථාවරය වන්නේ සනාථ කිරීමකින් තොරව වුව ද කටයුතු කිරීමට තරම් ඇයගේ සාක්ෂි ඒත්තු ගැන්වෙන්නේ නම් මිස, ලිංගික වරදකට ගොදුරු වූවකුගේ සනාථ කළ නොහැකි සාක්ෂි මත ක්‍රියා කිරීම භයානක බවය.[8] බොහෝ විට ස්ත්‍රී දූෂණ ක්‍රියා සිදු වන්නේ ස්වාධීන සාක්ෂිකරුවන් නොමැත පෞද්ගලික ස්ථානයන්හි වන බැවින් මෙය ගොදුරු වූ තැනැත්තා මත පැටවෙන දුෂ්කර බරක් වේ.[9]

කෙසේ වෙතත්, ස්ත්‍රී දූෂණය පිළිබඳ විධිවිධාන පමණක් සංශෝධනය කිරීම යුක්තියේ අරමුණු සපුරාලීම සඳහා ප්‍රමාණවත් නොවේ. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණ බොහොමයකට දඬුවම් නොලැබෙන අතර ස්ත්‍රී දූෂණ සිදුකරන පිරිමින්ගෙන් 96.5% ක් කිසිදු නීතිමය ප්‍රතිවිපාකයකට මුහුණ දී නොමැති බව වර්ෂ 2013 දී සිදු කරන ලද අධ්‍යයනයකින් සනාථ වූ අතර, එමගින් අදහස් කෙරෙනුයේ ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔවුන්ව අත්අඩංගුවට ගෙන හෝ සිරගත කර නොමැති බවයි.[10]

---

[7] ඉහත එම.

[8] *සුනිල් සහ තවත් අය එදිරිව නීතිපති,* [1986] 1 ශ්‍රී නීති වාර්තා 230, ලබා ගත හැකිය https://www.lawnet.gov.lk/wpcontent/uploads/2016/11/019-SLLR-SLLR-1986-V-1-SUNIL-AND-ANOTHER-v.-THE-ATTONEY-GENERAL.pdf, උපුටා දක්වනුයේ උපාලි සේනරත්න එදිරිව නීතිපති, CA 25/09 CAM 06.03.2014, ගුණවර්ධන එදිරිව නීතිපති, CA 378/2017 CAM 03.09.2019, මනතුංග එදිරිව නීතිපති CA 184/2014 CAM 01.11.2019

[9] ඉහත එම, හිංසනය වැළැක්වීම පිළිබඳ විපක්ෂ නායකයා විසින් පත්කළ කොමිෂන් සභාවේ සහ ගැහැණු ළමයින්ගේ වාර්තාවේ 28 පිටුව බලන්න.

[10] ඊ ෆුලු, එක්ස් වෝනර්, එස් මයිඩෙමා, ආර් ජුවෙක්ස්, ටී රොසෙලි සහ ජේ ලැන්ග්, 'සමහර පිරිමින් කාන්තාවන්ට එරෙහි හිංසනය භාවිතා කරන්නේ ඇයි සහ එය වළක්වා ගන්නේ කෙසේද? ආසියාවේ සහ පැසිෆික් සාගරයේ පිරිමින් සහ හිංසනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ බහු-රට අධ්‍යයනයෙන් ප්‍රමාණාත්මක සොයාගැනීම්' 2013, බැංකොක්: UNDP, UNFPA, එක්සත් ජාතීන්ගේ කාන්තාවන් සහ UNV 45 පිටුව, http://www.undp.org/content/dam/rbap/docs/Research%20&%20Publications/womens_empowerment/RBAPGender-2013-P4P-VAW-Report.pdf

අදාල නඩු අධිකරණයට පැමිණි විට පවා, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ දීර්ඝ කාලීනව පවතින ප්‍රමාදයන්, වෛද්‍ය-නීතික සාක්ෂි පටිගත කිරීමේදී පවතින දුර්වලතාවයන් සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට ගොදුරු වූවන්ගේ චිත්තවේගී හා මානසික සහයෝගයන් නොමැතිකම ආදී තත්වයන් යුක්තිය නිසි පරිදි පසිඳලීම සහතික කිරීම සඳහා අවධානය යොමු කළ යුතු ගැටළු වේ. අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ සමහර ප්‍රධාන දෝෂයන් මෙම වාර්තාවේ පහත පරිච්ඡේදවල වඩාත් විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

## *වෛවාහක ස්ත්‍රී දූෂණය*

ශ්‍රී ලාංකාවේ නීතිය යටතේ පිරිමියෙකු විසින් ස්ත්‍රියක තමාගේ භාර්යාව වන අවස්ථාවක වුව ද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන්වී සිටිය දී ඇගේ කැමැත්ත නොමැතිව මෛථුනයෙහි යෙදී ඇත්නම් එකී තැනැත්තා ස්ත්‍රී දූෂණය වරද සිදු කරයි.[11] මේ අනුව, වෛවාහක ස්ත්‍රී දූෂණය ශ්‍රී ලංකා නීතිය යටතේ අපරාධයක් නොවන අතර එය ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ක්‍රියා වලින් කාන්තාවන් ආරක්ෂා කිරීමේ දී උද්ගත වන විශාල අඩු ලුහුඬුකමකි.

පිරිමියෙකු සහ ඔහුගේ බිරිඳ අතර කැමැත්තකින් තොරව සිදුවන ලිංගික සංසර්ගය ස්ත්‍රී දූෂණයට සමාන නොවේය යන අදහසෙහි මූලාරම්භය යල්පැනගිය සංස්කෘතික පදනමක් තුළ පවතී. කාන්තාවක් යනු නීතිය යටතේ හුදෙක්ම තම ස්වාමිපුරුෂයාගේ දිගුවක් වැනි අදහස් මෙයට ඇතුළත් වන අතර එම නිසා වෛවාහක ස්ත්‍රී දූෂණය යනු හුදෙක් ඔහු විසින් අපරාධයක් කරන ලදැයි යන තර්කවිරහිත චෝදනාවට පාත්‍ර වීම; කාන්තාවක් යනු ස්වාමිපුරුෂයාගේ දේපළක් වන අතර වෛවාහක ස්ත්‍රී දූෂණය මඟින් දේපල හානි සිදුවීමක් සංස්ථාපනය නොවීම; ලිංගික බැඳීමට එකඟ වීම වූ කලී විවාහ ගිවිසුමෙහි අන්තර්ගත කොටසක් වන අතර; ස්ත්‍රියකට තම ස්වාමිපුරුෂයා විසින් තමාව දූෂණය කළ බවට චෝදනා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම වූ කලී නැවත සමාදානය වීමට අවස්ථාවක් නොමැති අන්දමට විවාහ සබඳතාවට හානි සිදුවීම ආදී තත්වයන් අන්තර්ගත වේ.[12]

වෛහක ස්ත්‍රී දූෂණය අපරාධයක් වශයෙන් හඳුන්වා දීම සඳහා සහ එය දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන හඳුන්වා දීමට අතීතයේ දී උත්සාහයන් කිහිපයක්ම ගෙන තිබේ.[13] කෙසේ වුවද, මෙකී උත්සහයන් කිසිවක් මඟින් වර්තමාන නෛතික රාමුවට කිසිදු සංශෝධනයක් සිදු කර නොමැත.

## *ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය*

දණ්ඩ නීති සංග්‍රහයේ 363(ඉ) වගන්තියට අනුව, අදාල ස්ත්‍රියගේ කැමැත්ත ඇතිව හෝ නැතිව වයස අවුරුදු 16 ට අඩු කාන්තාවක් සමඟ ලිංගික සංසර්ගය යනු ස්ත්‍රී දූෂණයකි. වයස අවුරුදු 16 ට අඩු ගැහැනු ළමයෙකුට ලිංගික සංසර්ගයට එකඟත්වය ලබා දීමට තරම් නීතිමය හැකියාවක් නොමැති බවට

---

11 363 (අ) වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය

12 ජේ සිටන්, 'නව බෝතල්වල පැරණි වයින්: විවාහක ස්ත්‍රී දූෂණ දීමනාව', 72 එන්.සී. එල්. රිවිට්. 261, 1993, පි. 264-268. ලබා ගත හැකිය https://scholarship.law.unc.edu/cgi/viewcontent.cgi?article=3524&context=nclr

13 අධිකරණ අමාත්‍යාංශය, 2017 කාර්ය සාධන වාර්තාව, 16 පිටුව, ලබා ගත හැකිය https://www.moj.gov.lk/web/images/pdf/progress_report/14.11.2017/English.pdf සහ අධිකරණ අමාත්‍යාංශය, 2018 කාර්ය සාධන වාර්තාව, පි 20, ලබා ගත හැකිය https://www.moj.gov.lk/web/images/pdf/progress_report/2018/English.pdf

ඇති අවබෝධය පදනම් කරගෙන මෙම ප්‍රතිපාදනය සැකසී තිබේ. මෙයට හේතුව වන්නේ, ළමයින් ආකර්ෂණීය බවට නම්‍යශීලී වීම, පරිණතභාවයක් නොමැතිකම හෝ පහසුවෙන් ඔවුන්ගේ මනස වෙනස් කරවිය හැකි වීම ආදී තත්වයන් හේතුවෙන් සහ යම් ලෙසකින් ඔවුන් ලිංගිකව ක්‍රියාකාරී වූ විට, ගර්භණීභාවයට පත්වීම වැනි ලිංගිකත්වයේ බරපතල ප්‍රතිවිපාක ඇති බවට යමෙකු විසින් සම්පූර්ණයෙන් වටහා ගත යුතු මෙන්ම එවැනි තත්වයක් සඳහා ශාරීරික වශයෙන් සූදානම් වීමක් පිළිබඳ අවබෝධයක් පැවතිය යුතුය යන මතයයි.[14] මේ අනුව, මෙම ප්‍රතිවිපාක වලින් ඔවුන් ආරක්ෂා කර ගැනීම සඳහා සහ ඔවුන් එවන් තත්වයකට මුහුණ දීමට සුදුසු වයස් සීමාවකට එළැඹෙන තෙක් තරුණ ගැහැණු ළමයින් සමඟ ලිංගික සංසර්ගයෙහි යෙදීම තහනම් කිරීම සඳහා නීතිය මගින් යම් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

## ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සඳහා අවම අනිවාර්ය දඬුවම

ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට දඬුවම දණ්ඩ නීති සංග්‍රහයේ 364 වගන්තිය යටතේ පෙන්වා දී ඇත. සාමාන්‍ය තත්වයන් යටතේ, ස්ත්‍රී දූෂණය සඳහා වන දඬුවම වසර 7 ත් 20 ත් අතර සිර දඬුවමක් වන අතර එයින් අදහස් වන්නේ ස්ත්‍රී දූෂකයෙකුට වසර 7 කට අඩු සිර දඬුවමක් ලබා දීමේ හැකියාව අධිකරණයකට නොමැති බවයි. ස්ත්‍රී දූෂණය නම් අපරාධය සඳහා අවම අනිවාර්ය දඬුවම වසර 7 කි. කෙසේ වෙතත්, මෙකී වගන්තිය තුළින්ම පෙන්වා දෙන පරිදි, යම් යම් බරපතල සිද්ධිමය තත්වයන් හිදී අවුරුදු 10 ත් 20 ත් අතර බරපතල සිර දඬුවමක් නියම කළ අන්දමේ විධිවිධාන ද ඇත. මේ සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 364 (2) (ඉ) වගන්තිය යටතේ පෙන්වාදෙනු ලබන අකාරයට වයස අවුරුදු 18 ට අඩු ස්ත්‍රියක් දූෂණය කළ විට එයද මෙයට ඇතුළත් වේ. වින්දිතයා විසින් ස්වකීය කැමැත්ත ලබා දී ඇති විට පවා සිදුවන ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ පිළිබඳ සිද්ධීන් ද මෙයට ඇතුළත් වේ.

මෙය සමහර අවස්ථාවන්හි දී අයුක්ති සහගත තත්වයකට හේතු පාදක විය හැකි බව පිළිගැනීම සඳහා, පොදුවේ සාමාන්‍යයෙන් හැඳින්වෙන 'බාලවයස්කාර මුක්තිය' හෙවත් 'රෝමියෝ සහ ජුලියට් වගන්තිය' ලෙස හැඳින්වෙන ව්‍යතිරේකයක් නීතිය මඟින් එය පෙන්වා දෙනු ලැබේ. දණ්ඩ නීති සංග්‍රහයේ 364 (2) වගන්තිය ප්‍රකාරව ගත් කල, වයස අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් ඒ වරද සිදු කොට ඇති අවස්ථාවක, අදාල වරද සිදු කළ තැනැත්තා වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තකු වන සහ සංසර්ගය සිදුකොට ඇත්තේ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිව වන අවස්ථාවක, අවුරුදු දහයකට අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය යනුවෙන් පෙන්වා දෙනු ලැබේ.

මෙකී විධිවිධානයෙහි පවතින තත්වය නීතියෙහි ඇති පරස්පර විරෝධීතාවයක් හෙළි කරනු ලබන අතර ඒ මන්ද යත්, එකී විධිවිධානය ඔස්සේ වයස දහසයකට අඩු (16) ට අඩු ගැහැණු ළමයෙකු විසින් සිය කැමැත්ත ලබා දීම ගැන සඳහන් කරන අතරම, එවැනි ස්ත්‍රියකට එසේ කිරීමේ නෛතික හැකියාවක් නොමැති බව ද නීතිය විසින්ම පිළිගනු ලැබීමයි. කෙසේ වෙතත්, නීතියට අනුකූලව ගත්කල මෙහිදී

[14] පිලිප් ග්‍රැහැම්, 'ධාරාවට එරෙහි වීම: ලිංගික කැමැත්ත ප්‍රකාශ කිරීමේ වයස අඩු කිරීම', බී.ජේ.සිච් බුලටින් (2018) 42, 162-164, ලබා ගත හැකිය පිලිප් ග්‍රැහැම්, 'ධාරාවට එරෙහි වීම: ලිංගික කැමැත්ත ප්‍රකාශ කිරීමේ වයස අඩු කිරීම', බී.ජේ.සිච් බුලටින් (2018) 42, 162-164, ලබා ගත හැකිය https://www.cambridge.org/core/services/aop-cambridge-core/content/view/DE52EEC76C801FDE50593F82BFD0B843/S2056469417000262a.pdf/against_the_stream_lowering_the_age_of_sexual_consent.pdf

වරදක් සිදු නොවූ බව මින් අදහස් නොවේ; එමඟින් සිදු කෙරෙනුයේ අදාල වරදට දඬුවම් කිරීමේ දී පුළුල් අභිමතයක් භාවිත කිරීමට හැකි වන පරිදි ඉඩ ප්‍රස්ථාවක් ලබා දීමය. මෙම වගන්තියේ ඇති ප්‍රධාන අඩුපාඩුවක් නම්, අදාල ව්‍යතිරේකය අදාළ වීම උදෙසා එකී වින්දිතයා සිටිය යුතු වයස් සීමාවක් එමගින් නියම නොකිරීමයි. මේ අනුව, වයස අවුරුදු 18 ට අඩු පිරිමි ළමයෙක් විසින් ඔහුගේ වයසට සමාන ගැහැනු ළමයෙකු ස්වකීය කැමැත්ත ඇතිව පැවති තත්වයක් පමණක් නොව, ඕනෑම වයසක ගැහැණු ළමයෙකුට ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් සිදු කරන්නේ නම්, එහිදී ද ඔහු මෙකී ව්‍යතිරේකයෙහි නිර්වචනය තුළට ඇතුළත් වනු ඇත.

අනිවාර්ය අවම දඬුවම ඇතුළත් කිරීම වූ කලී බොහෝ මතභේදාත්මක හා විවාදයන්ට භාජනය වන මාතෘකාවකි. බොහෝ වැරදි සම්බන්ධයෙන් ගත් කල, වරදකට වැරදිකරුවෙකුට ලබා දිය හැකි උපරිම දඬුවම නීතියෙන් නියම කර ඇති අතර එමඟින් එම සීමාව තුළ ලබා දිය යුතු දඬුවම සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා විනිසුරුවරයාට අභිමතය ලබා දී තිබේ. කෙසේ වෙතත්, නීතිය මඟින්ම අවම දඬුවමක් නියම කර ඇති අවස්ථාවක, අදාල වරද සම්බන්ධයෙන් ඊට වඩා අඩු දඬුවමක් ලබා දීම සඳහා ඇති අධිකරණ අභිමතයට සීමාවක් පැනවේ. යම්කිසි නඩුවකට අදාළ සිද්ධිමය කරුණු හා පැවති තත්වයන් මත පදනම්ව දණ්ඩනයක් තීරණය කළ යුතු බව පැහැදිලි වන අතර, මෙම අභිමතය මඟින් අපේක්ෂා කරනු ලබන්නේ යුක්තියේ අරමුණු නිසි ලෙස සපුරාලීම සහතික කිරීමයි. ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් මෙය කළ නොහැකි වීම යුක්තිය ඉටුවීමේ හැකියාවට යම් ආකාරයක බාධාවක් වේ.

සමාජයේ පවතින ආර්ථික තත්වයන් සහ වෙනත් ප්‍රායෝගිකභාවයන් හේතුවෙන්, සමහර ප්‍රදේශවල ගැහැණු ළමයින් කුඩා කල සිටම, සමහර විට වයස අවුරුදු 16 ට පෙර තම සහකරුවන් සමඟ එක්ව කටයුතු කරමින් එකට වාසය කිරීම දැකිය හැකිය.[15] එවැනි අවස්ථාවන්හිදී, වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙක් වයස අවුරුදු 18 ට වැඩි පිරිමි ළමයෙකු සමඟ ලිංගික සංසර්ගයෙහි යෙදී සිටී නම්, ඇයගේ කැමැත්ත ඇතිව වුවද, එය නීතියෙන් ලබා දී ඇති ව්‍යතිරේකයට යටත් නොවන ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයකි. තරුණියන්ගේ යහපත උදෙසා ගැහැණු ළමයෙකු සඳහා අවම වයස් සීමාවක් පැනවීම නීතිගත කර ඇති නමුදු, පවත්නා සමාජ තත්වයන් අනුව, නීතිය සෑම විටම මෙම අරමුණු ඉටු කරනු ලබන බවක් නොපෙනේ.

නඩු විභාග කිරීමේ දී පවතින දීර්ඝ ප්‍රමාදයන් හේතුවෙන් අදාල කාන්තාවගේ නඩුව විභාග කිරීමේ අවස්ථාවට පැමිණෙන විට බොහෝ විට ඇය වැඩිහිටියෙකු බවට පත්ව ඇති අතර සමහර අවස්ථාවන්හි දී මෙම කාන්තාවන් විවාහ වී තමන්ගේම පවුල් සමඟ සිටින අතර වරද සම්බන්ධයෙන් නඩු පැවරීමට තවදුරටත් උනන්දුවක් නොදක්වන තත්වයක් පෙන්නුම් කරනු ලබයි. තවත් සමහර අවස්ථාවන්හි දී අදාල වින්දිතයා වැරදිකරු සමඟ විවාහ වී පවුල් ජීවිතයක් ගත කරමින් සිටිය හැකි අතර එහිදී දඬුවම් ලබාදෙනු ලබන කාලය වන විට ඇය ඔහු මත ආර්ථික වශයෙන් යැපෙන අවස්ථා ද තිබිය හැකි අතර එහිදී අදාල වරදකරුට දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් විනිසුරුවරුන්ද අභියෝගාත්මක තත්වයකට මුහුණ දෙනු ලැබේ.

[15] ඉමේෂා මධුභානි, "ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ නීති: මූලික කරුණු, සන්ඬේ ඔබ්සර්වර්, 2019 දෙසැම්බර් 15, https://www.sundayobserver.lk/2017/09/10/issues/statutory-rape-laws-sri-lankaunderpinning-issues

වර්ෂ 2008 දී උතුරු මැද පළාතේ මහාධිකරණ විනිසුරුවරයෙකු විසින් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් හි සම්බන්ධ නඩුවකට අදාල නඩු විභාගයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 (1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමක් කළේය.[16] වර්ෂ 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ (සංශෝධන) පනතේ 364 (2) වගන්තිය මගින් එම වගන්තිය යටතේ වරදකට වැරදිකරුවකුට දඬුවම් නියම කිරීමේදී අධිකරණ අභිමතය ඉවත් කර තිබේදැයි මහාධිකරණය විසින් විමසා සිටින ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මතය වූයේ, කැමැත්ත යනු අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි ක්‍රියාත්මක කළ යුතු කරුණු වශයෙන් සලකනු ලැබීම හේතුවෙන්, කැමැත්ත ලබා ගත් අවස්ථාවන්හිදී ස්ත්‍රී දූෂණය සඳහා දඬුවම් පැනවීම සම්බන්ධයෙන් අවම කාල සීමාවක් නියම කිරීමෙන් අධිකරණයේ අභිමතය සීමා කළ නොහැකි බවයි.[17] ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම මතය ඉදිරිපත් කිරීමෙන් පසුව මහාධිකරණ විසින් ඒ සම්බන්ධයෙන් පුළුල් ලෙස අර්ථකථනයන් ලබා දී ඇති අතර එහිදී අනිවාර්ය දඬුවමක් සඳහා අවම කාල සීමාවක් නියම කර ඇති තත්වයන්හි දී වුවද, කැමැත්තකින් තොරව සිදුවූ ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් පවා අඩු දඬුවමක් නියම කිරීමට විනිසුරුවරුන්ට අභිමතය ඇති බව විද්‍යමාන වන අයුරින් කටයුතු කර තිබේ.[18]

ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව මීට පෙර අවස්ථා කිහිපයකදීම මෙම වගන්තිය විමසුමට ලක් කර එය සංශෝධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබේ.[19] එකී නිර්දේශ කිසිවක් නීතියක් වශයෙන් සම්මත කර නොමැත.

## ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

වර්ෂ 2005 වසරේ අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත (Prevention of Domestic Violence Act No 34 of 2005 (PVDA)) ක්‍රියාත්මක වූයේ ඒ සම්බන්ධයෙන් වසර ගණනාවක් පුරාවට කාන්තා අයිතිවාසිකම් සංවිධානයන් මගින් සිදු කරන ලද බලපෑම් කිරීමෙන් පසුවය.[20] මෙම නීතිය සම්මත වීමට පෙර, සහකරුවන්ගේ හිංසනය පිළිබඳ සංකල්පීයමය තත්වය සම්බන්ධයෙන් සහ ඊට නිසි ප්‍රතිචාර දැක්වීම පිළිබඳ මතභේදමය තත්වයක් පැවතුනි.[21] ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පවුල තුළ පෞද්ගලික කාරණයක් බවත්, මෙවැනි නීතියක් මගින් පවුල් ඒකකයේ පරිශුද්ධභාවය බිඳී යා හැකි

---

16 S.C යොමු 03/08, 2008 [B.L.R] 160.

17 ඉහත එම, හිංසනය වැළැක්වීම සහ ගැහැණු ළමයා සම්බන්ධයෙන් විපක්ෂයේ නායකයා විසින් පත්කළ කොමිසමේ 29 වන පිටුව

18 ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව, ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ හා ඒ හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් දඬුවම් නියම කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ පැහැදිලි සටහනක් 2014 දී ලබා ගත හැකිය.
http://lawcom.gov.lk/web/images/stories/reports/explanatory_note_on_the_sentencing_policy.pdf

19 ඉහත එම

20 මැනුවෙලා කොලොම්බිනි, සුසන්නා එච් මේහිව්, රග්න්හිල්ඩ් ලුන්ඩ්, නව්ප්‍රීට් සිං, කතරිනා ස්වහන්බර්ග්, ජෙනිෆර් ඉන්ෆන්ටි, බෙරිට් ස්කේයි හා කුමුදු විජේවර්ධන, " කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දේශපාලන ප්‍රමුඛ්‍යතාවයන් තීරණය කරනු ලබන සාදක-ශ්‍රී ලංකාව තුළ එය මැඩබීමේ ප්‍රතිපත්ති ", 2018, https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC5970471/>

21 චුලනි කොඩිකාර, බැට කෑ භාර්යාවන් හෝ යැපෙන මව්වරුන්? නීතියේ පවුල් මතවාදය පිළිබඳ සාකච්ඡා කිරීම. කාන්තාවන්ට එරෙහි හිංසනය. 2018 ජූනි; 24 (8): 901-921, ලබා ගත හැකිය
https://journals.sagepub.com/doi/10.1177/1077801217724452

බවත් අවධාරණය කරමින් සමාජයේ බොහෝ අංශ විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත බලාත්මක කිරීමට විරුද්ධ විය.[22]

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත සම්මත කිරීම කාන්තාවන්ගේ ජයග්‍රහණයක් වූ අතර, අවධානය යොමු කළ යුතු අඩුපාඩු කිහිපයක් ද එකී නීතිය සම්බන්ධයෙන් තිබේ.[23]

## *ගෘහස්ථ හිංසනය පිළිබඳ නිර්වචනය*

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මඟින් ගෘහස්ථ හිංසනය පිළිබඳ සාපරාධී වරදක් නිර්මාණය නොකරන අතර, පනතේ විස්තර කර ඇති ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව ගෘහස්ථ හිංසනයන්ට ගොදුරු වූවන්ට ආරක්ෂණ ආඥාවන් ලබා ගත හැකි ආකාරයේ යෝජනා ක්‍රමයක් සපයයි.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙ හි ඇති විශාලතම අඩුපාඩුවක් නම් "ගෘහස්ථ හිංසනය" පිළිබඳ පුළුල් අර්ථ දැක්වීමක් එහි අන්තර්ගත නොවීමයි. එකී පනතේ 23 වන වගන්තියට (අර්ථ නිරූපණ වගන්තිය) අනුව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අර්ථ දැක්වෙන්නේ *'(අ) 1 වන උපලේඛනයේ දක්වා ඇති වරදක් වන ක්‍රියාවකි;' (ආ) හෝ ගෘහය තුළ දී හො ඉන් පිටත දී අදාල පුද්ගලයා සහ හානියට පත් වූ පාර්ශවය අතර පවතින්නා වූ පුද්ගල සම්බන්ධතාවයක් හේතුවෙන් එකී අදාල පුද්ගලයා විසින් සිදු කරනු ලබන හෝ සිදුවීමට ඉඩකඩ සලසනු ලබන ඕනෑම චිත්තවේගී අපයෝජනයක්' වශයෙනි.*

ගෘහස්ථ අපයෝජනයට ලක්විය හැකි වැරදි දක්වා ඇති පනතේ 1 වන උපලේඛනයට දණ්ඩ නීති සංග්‍රහයේ XVI වන පරිච්ඡේදයේ (මනුෂ්‍ය ශරීරය සම්බන්ධ හා ජීවිතය සම්බන්ධ වැරදි), බලෙන් ලබා ගැනීම සහ සාපරාධී බිය ගැන්වීම හෝ මෙම වැරදි වලින් එකක් හෝ කිරීමට තැත් කිරීම ඇතුළත් වේ.

චිත්තවේගීය අපයෝජනය යන්න අර්ථ දැක්වෙන්නේ *'අගතියට පත් පුද්ගලයෙකු වෙත යොමු කෙරෙන බරපතළ ස්වභාවයේ කුරිරු, අමානුෂික, අවමන් සහගත හෝ නින්දිත හැසිරීමේ රටාවක්' වශයෙනි'.*

මෙම අර්ථ දැක්වීමෙන් ප්‍රධාන කරුණු තුනක් පැන නගීඃ

i. පළමුව, දණ්ඩ නීති සංග්‍රහයේ සමස්ත පරිච්ඡේදයක්ම ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වලට හේතු විය හැකි භෞතික ක්‍රියාවන් ලෙස අන්තර්ගත කිරීම වූ කලී ව්‍යාකූල සහගත වන අතර එය සැමවිටම අර්ථවත් නොවේ. දණ්ඩ නීති සංග්‍රහයේ XVI වන පරිච්ඡේදය 293 සිට 365 දක්වා වූ වගන්ති විශාල ගණනකින් සමන්විත වේ. එකී වගන්තීන් අතරට, රජයේ සේවකයකු තම යුතුකම ඉෂ්ට කරනු ලැබීමෙන් වැළැක්වීම සඳහා කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම හෝ බරපතල තුවාල සිදු කිරීම (323 සහ 324 වගන්ති) සහ තම යුතුකම ඉෂ්ට කරනු ලැබීමෙන් වැළැක්වීම සඳහා රජයේ සේවකයකුට බලහත්කාරය පෑම (344 වගන්තිය) වැනි වගන්තීන් පවා මෙයට ඇතුළත් වන අතර එවන් වැරදි ගෘහස්ථ හිංසනයක සම්බන්ධයෙන් වන තත්වයට එතරම් ගැලපීමක් නොමැති බව පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, වඩාත් වැදගත් කාරණය නම්, ගෘහස්ථ අපයෝජනයේ

[22] චූලනි කොඩිකාර, 'බත ඉදෙන තෙක් පමණක්ද? ගෘහස්ථ හිංසනය පිළිබඳ පනත, ශ්‍රී ලංකාවේ පවුල් මතවාදය සහ සංස්කෘතික තත්වයන්", ICES ක්‍රියාකාරී ලිපි මාලාව, වැඩ පත්‍රිකාව n. 01. 2012, ලබා ගත හැකියhttp://ices.lk/wpcontent/uploads/2018/07/Only-Until-the-Rice-is-Cooked.pdf

[23] අඩුපාඩු පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් සඳහා ඉහත බලන්න.

භෞතික ක්‍රියාවන් නිශ්චිතව පෙන්වා දී ඇති හා දණ්ඩ නීති සංග්‍රහයේ පවත්නා විධිවිධානවලට පමණක් සීමා වී ඇති අතර, එයින් අදහස් වන්නේ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය වැනි ක්‍රියාවන් ගෘහස්ථ හිංසනය පිළිබඳ අර්ථ දැක්වීමෙන් මුළුමනින්ම බැහැර කර ඇති බවයි.[24]

ii. දෙවනුව, මෙම කොටස යටතේ චිත්තවේගීය හිංසනය අර්ථ දැක්වීමට කුරිරු, අමානුෂික, අවමන් සහගත හෝ නින්දිත හැසිරීම් ඇතුළත් වනවා පමණක් නොව, එවන් සැලකීමේ රටාවෙහි 'බරපතල ස්වභාවයක්' පැවතීම ද අවශ්‍ය වේ. එවන් සැලකීමේ රටාවකින් සමන්විත වන්නේ කුමකින් ද යන්න පිළිබඳ කිසිදු සඳහන් කිරීමක් නොමැති අතර, 'බරපතල ස්වභාවයක්'[25] සංස්ථාපනය වී ඇති බවට සැලකීම සඳහා කුරිරු, අමානුෂික, අවමන් සහගත හෝ නින්දිත හැසිරීම ආදියෙහි පදනම් සීමාව කවරක් ද යන්න පැහැදිලි නැත. ඒ සම්බන්ධයෙන් පැහැදිලි අර්ථ දැක්වීමක් නොමැති පසුබිමක මෙය අධිකරණය විසින් පටු ලෙස අර්ථ දැක්වීමක හේතු පාදක විය හැකි සේම එමඟින් වින්දිතයින්ට ලබා දෙන ආරක්ෂණය සම්බන්ධයෙන් ද සීමාකාරී තත්වයක් ඇති කරයි.

iii. තෙවනුව, මෙකී අර්ථ දැක්වීම තුළ ශාරීරික හා මානසිකව සිදුවන හිංසනයන් යන දෙආකාරයම ආවරණය කරනු ලබන මුත් එයට පැහැදිලිවම ආර්ථික අපයෝජනය ඇතුළත් නොවේ. නිවසේ ස්ත්‍රී පුරුෂ අසමානතාවය ආර්ථික ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි අතර, එමඟින් එක් සහකරුවෙකු විසින් බිය ගැන්වීම සහ බලහත්කාරය පෑම ආදී තත්වයන් මඟින් අනෙකාට ආර්ථික සම්පත් වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව වළක්වනු ලැබිය හැකිය.[26] මෙමඟින් වින්දිතයාට හිංසනකාරී සම්බන්ධතාවයක් අත්හැරීම සඳහා අවශ්‍ය ආර්ථිකමය ප්‍රතිලාභ ලැබෙන මාර්ගයන් අහිමි වීමකට මුහුණ පෑ හැකිය. ආර්ථික අපයෝජනය යනු, විශේෂයෙන් කාන්තාවන්ට වැඩ කිරීමට නොහැකි සහ ස්වාධීන ආදායම් මාර්ගයක් නොමැති තත්වයන් හිදී, ගෘහස්ථ හිංසනය වැඩි වශයෙන් සිදුවන එක්තරා ආකාරයක් වශයෙන් පෙන්වා දිය හැකිය.[27] මෙය මානසිකව හිංසනය සිදුවන එක්තරා ස්වරූපයක් වන අතර, ගෘහස්ථ හිංසනය පිළිබඳ අර්ථ දැක්වීමට එය පැහැදිලිව ඇතුළත් නොකිරීම, එම වචනය පිළිබඳ පටු අධිකරණමය අර්ථකථනයක් මඟින් එය අදාල අර්ථ දැක්වීමෙන් බැහැර කිරීමේ හැකියාවක් නිර්මාණය කෙරේ.

---

[24] රෝස් විජේසේකර, 'ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනතේ සමහර අංශ පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක්: විවේචනයක්', ශ්‍රී ලංකා ජාත්‍යන්තර නීතිය පිළිබඳ ජර්නලය, 2011, http://archive.cmb.ac.lk:8080/research/bitstream/70130/257/1/Sri%20Lanka%20Journal%20of%20Intrnational%20Law.doc

[25] සුනේත්‍රා එම්. ඊ. ගුනෙතිලෙක්, 'ගෘහස්ථ හිංසනය: ශ්‍රී ලාංකික කාන්තාව තවමත් පෞද්ගලික ක්ෂේත්‍රයේ සිරවී සිටීද?', OUSL ජර්නලය (2015) වෙළුම. 8, (පි. 101-123), පි 115, ලබා ගත හැකිය https://ouslj.sljol.info/articles/abstract/10.4038/ouslj.v8i0.7321/

[26] ලෝක බැංකුව, 'ගෘහස්ථ හිංසනය සහ ලිංගික හිංසනයට එරෙහි කාන්තාවන්ගේ නෛතික රැකවරණය පිළිබඳ ගෝලීය සහ කලාපීය ප්‍රවණතා', 2018, ලබා ගත හැකිය http://pubdocs.worldbank.org/en/679221517425064052/EndingViolenceAgainstWomenandGirls-GBVLawsFeb2018.pdf

[27] ඉහත එම.

### *ගෘහස්ථ හිංසනය පිළිබඳ සාපරාධී වරදක් හඳුන්වා දී නොමැත*

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි අවධානය යොමු වී ඇත්තේ ආරක්ෂක ආඥා මගින් වින්දිතයා ආරක්ෂා කිරීමය. ආරක්ෂක ආඥාවක් උල්ලංඝනය වී ඇති සීමිත අවස්ථාවන්හිදී හැර, වරදකරු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව මෙකී පනත මඟින් සැලකිලිමත් නොවේ. අපරාධ නඩු පැවරීමට වඩා වින්දිතයින්ට රැකවරණය ලබා ගත හැකි යෝජනා ක්‍රමයක් තිබීම වැදගත් වන්නේ විශේෂයෙන් ඔවුන් එවැනි අපයෝජකයන් මත ආර්ථික වශයෙන් යැපෙන විට අදාල වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීමට ඇති බිය නිසා වින්දිතයින් ඉදිරියට පැමිණීමට අකමැති විය හැකි නිසාවෙනි.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මඟින් ගෘහස්ථ හිංසනය පිළිබඳ නව වරදක් නිර්මාණය නොකරන අතර එයින් අදහස් කරන්නේ අපයෝජකයාට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය අවස්ථාවකදී පවා වැරදිකරුවන්ට දඬුවම් කිරීම සඳහා පවත්නා දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන මත රඳා පැවතිය යුතු බවයි.

ගෘහස්ථ හිංසනයන්ට එරෙහිව නඩු පැවරීම සඳහා දණ්ඩනීති සංග්‍රහයේ ඇති තනි වැරදිවලට යොමු වීමට සිදු වීම හේතුවෙන් අවාසි ගණනාවක් ඇත:

i. පළමුවෙන්ම, වරදෙහි ඔප්පු කළ යුතු අංග ලක්ෂණ වූ කලී ගෘහස්ථ හිංසනය පිළිබඳ වරදක් සම්බන්ධයෙන් වන විට එය අදාල ගෘහස්ථ හිංසනයෙහි වින්දිතයන් කෙරේ ප්‍රතිචාර දැක්වීම කෙරේ අවධානය යොමු කරනු ලබන අතර එහිදී දණ්ඩ නීති සංග්‍රහයේ පවත්නා විධිවිධානවලට වෙනස් තත්වයක් පවතී.

ii. දෙවනුව, මානසික හිංසනය පවත්නා සාපරාධී විධිවිධානයකට සම්බන්ධ නොවන අතර, අදාල මානසික අපයෝජනය කෙතරම් දරුණු වුවත්, යම් වින්දිතයෙකුට මානසික ගෘහස්ථ හිංසනයක් සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබන වරදකරුවෙකුට දඬුවම් කළ නොහැකිය.

iii. තෙවනුව, දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් නියම කිරීමේ ප්‍රතිපත්තිය පිළිපැදිය යුතුය. ගෘහස්ථ හිංසනය සම්බන්ධයෙන් පවතින සුවිශේෂී තත්වයන් හේතුවෙන්, ගෘහස්ථ අපයෝජන අවස්ථා වලදී වෙනම වරදකට බරපලතළ දඬුවම් නියම කරනු හැකිව තිබුණි. එවැනි විධිවිධාන ඔස්සේ රජය විසින් එවැනි ක්‍රියාවන් නොඉවසීමේ ස්ථාවරය සංකේතවත් කරනු ලබන අතර එමගින් එවැනි හිංසන ක්‍රියාවන් සිදුවීම වැළැක්වීමේ බලපෑමක් ඇති කරනු ඇත.

කෙසේ නමුත්, එවැනි නීතියක් හඳුන්වාදීම සිදු කළ යුත්තේ වින්දිතයින්ගේ සමාජ-ආර්ථික තත්වයන් සහ ඔවුන් මුහුණ දෙන යථාර්ථයන් සැලකිල්ලට ගනිමිනි. වර්තමාන සන්දර්භය තුළ, සාපරාධී වරදක් හඳුන්වා දීමේදී යම් ආකාරයක විමසුමක් සිදුකොට එවන් පිළියමක් යෙදීම වඩාත් විචක්ෂණශීලී විය යුතු වන්නේ එසේ නොවුනහොත් එමගින් කාන්තාවන්ට ආරක්ෂාව අවශ්‍ය වූ විට ඉදිරියට පැමිණීම වළක්වාලමින් ප්‍රතිඵල රහිත විය හැකි බැවිනි. ගෘහස්ථ හිංසනය පිළිබඳ සාපරාධී විධිවිධාන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි කොටසක් වශයෙන් නොව දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානයක් ලෙස ඇතුළත් කළ හැකිය. ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි 21 වන වගන්තියෙන් පෙන්වා

දෙනු ලබන්නේ අගතියට පත් පුද්ගලයෙකුට වෙනම සිවිල් හෝ අපරාධමය නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීමට පනතේ කිසිවක් මඟින් අවහිර නොකරන බවයි.

### *අධිකරණයන්ට ප්‍රවේශවීමේ සීමාවන්*

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි 2 (2) වගන්තියට අනුව, වැඩිහිටි වින්දිතයෙකු සම්බන්ධයෙන් ආරක්ෂක ආඥාවක් ඉල්ලා අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමට අවසර ඇත්තේ අගතියට පත් පුද්ගලයාට හෝ ඔවුන් වෙනුවෙන් පොලිස් නිලධාරියෙකුට පමණි. වැඩිහිටි වින්දිතයාට අධිකරණයට පැමිණීමට නොහැකි අවස්ථාවන්හිදී මෙම සීමාව හේතුවෙන් සැලකිය යුතු දුෂ්කරතාවන්ට මුහුණ දීමට හේතු විය හැකිය. මෙවැනි තත්වයක දී, වින්දිතයාට සිදුව තිබිය හැකි තුවාල, මානසික කම්පනය හෝ ගෘහස්ථ හිංසනය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මූල්‍යමය ශක්තියක් නොමැති වීම ; හෝ වින්දිතයා අපයෝජකයාගෙන් සැඟවී සිටීම ආදී වශයෙන් වූ හේතු කිහිපයක් නිසා මෙය දුෂ්කර විය හැකිය. එවැනි තත්වයන් තුළ, වින්දිතයාගේ නියෝජිතයකු වශයෙන් පෙනී සිට තෙවන පාර්ශවයන්ට අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කිරීමේ හැකියාව පැවතිය යුතු වේ.

තවද, ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි 2 (3) වගන්තියට අනුව අයදුම්පතක් අනුපිටපතක් සහිතව පනතේ උපලේඛනයේ දක්වා ඇති පරිදි නියමිත ආකෘතියෙන් යුක්තව; මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ යුතුය. එසේ නිශ්චිත ආකෘතියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය වැනි දැඩි පටිපාටිමය අවශ්‍යතා හේතුවෙන් එකී පද්ධතියට සෑම තැනැත්තකුටම පහසුවෙන් ප්‍රවේශ වීමේ නොහැකියාවක් උද්ගත කරන බැවින් මෙම තත්වය මඟින් වින්දිතයෙකුට දුෂ්කරතා ඇති කළ හැකිය. යම් හදිසි අවස්ථාවකදී වින්දිතයෙකුට ඉතා කඩිනමින් අධිකරණයක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව පැවතිය යුතු වේ. මෙහි දී පෙන්වා දෙන ලද පිරිදි, අධිකරණයට පිවිසීම සඳහා බරපතල තාක්ෂණික බාධක පවතින විට, වින්දිතයින්ට ඔවුන්ගේ ජීවිතය ක්ෂණිකව අනතුරට පත්විය හැකි අවස්ථාවල දී පවා නීති ආධාර ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට සිදු විය හැකි වේ.

### *පනත බලාත්මක කිරීමේ ගැටළු*

අවසාන වශයෙන් ගත් කල, ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත තුළ ගැටලු කිහිපයක් ඇති අතර, විශාල වශයෙන් සමහර ගැටළු පවතින්නේ අදාල පනත බලාත්මක කිරීම සම්බන්ධයෙන් වන අතර; ගෘහස්ථ හිංසනයෙන් පීඩාවට පත්වන කාන්තාවන්ට ස්වකීය පවුල් ජීවිතයෙහි පැවැත්ම වෙනුවෙන්[28] එකී හිංසනකාරී තත්වයන් විවාහයේ සාමාන්‍ය කොටසක් ලෙස අදාල අපයෝජනය විඳදරා ගැනීමට දිරිගන්වනු ලබන අතර එකී තත්වයන් හේතුවෙන් පනතෙහි අවම බලපෑමක් ඇති තත්වයක් පවතී. තවද, ගෘහස්ථ හිංසනය පිළිබඳ බොහෝ සිද්ධීන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි විධිවිධානයන් ප්‍රකාරව නොව පොලීසිය මැදිහත් වීමෙනි.[29]

---

[28] චුලනි කොඩිකාර, 'ශ්‍රී ලංකාවේ ගෘහස්ථ හිංසනයෘ විකල්ප කතිකාවේ බලය', විවෘත ප්‍රජාතන්ත්‍රවාදය, 2015 මාර්තු 6, ලබා ගත හැකිය https://www.opendemocracy.net/en/5050/domestic-violence-in-sri-lanka-power-of-alternativediscourse/

[29] ප්‍රතිපත්ති රාමුව සහ ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (SGBV) විසඳීම සඳහා වන ජාතික සැලැස්ම 2016 -2020, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, 2016 ජූනි. http://gbvforum.lk/rlibrary/document/SGBV%20National%20Action%20Plan.pdf

නඩු කටයුතු පවත්වාගෙන යාමේදී උද්ගතවන ප්‍රමාදයන් ද ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතෙහි සාර්ථකත්වයට බාධාවක් වන බව වාර්තා වේ.[30] නඩුව ගොනු කරන අවස්ථාව වන විට වින්දිතයෙකුට අතුරු ආරක්ෂක ආඥාවක් ලබා ගත හැකි අතර, එය ලබා දීමට අධිකරණයට අභිමතය ඇති සේම, අදාල විමර්ශනය පැවැත්වීම සඳහා දිනයක් අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ලද දින සිට දින 14 කට නොවැඩි කාලයක් ඇතුළත ලබාදීමට ක්‍රියා කළ යුතුය. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් ප්‍රායෝගික තත්වයන් සලකා බලන විට පැහැදිලි වන්නේ අදාල විමර්ශනය පෙන්වා දී ඇති මෙම නියමිත කාල සීමාව තුළ සිදු නොවන අතර එමගින් උද්ගතව ඇති තත්වයෙහි හදිසි අවශ්‍යතාව සපුරාලීම සඳහා පනතේ සාර්ථකත්වයට පත්වීමේ සීමා වීමක් සිදු වේ.[31] වගඋත්තරකරුට නියෝග ලබා දී ඇති බවට සෑහීමකට පත්විය හැකි කොන්දේසියක් මත අදාල විමර්ෂණයට වගඋත්තරකරුගේ පැමිණීමකින් තොරව වුව ද අධිකරණයට ස්වකීය විමර්ශනය ඉදිරියට ගෙන යා හැකිය වුව ද, නියමිත වේලාවට වගඋත්තරකරුට[32] නියෝග ලැබීමට සැලැස්වීම නොකරන කල්හි උද්ගත වන ප්‍රමාදය වලකා ගැනීම සඳහා එවැනි දැනුම් දීමේ සේවාව කඩිනම් කිරීම සහතික කිරීම සඳහා විධිවිධාන මෙකී පනතෙහි පෙන්වා දී නොමැත.[33]

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතට අවැසි සංශෝධන සිදු කිරීම සඳහා වර්ෂ 2018[34] දී කැබිනට් අනුමැතිය ලබා දී ඇතත්, මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රගතියක් ලබා නොමැත. ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ ගැටළුව විසඳීම සඳහා හුදෙක් නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් බලාත්මක කිරීම ප්‍රමාණවත් නොවන ආකාරය ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මගින් විද්‍යමාන වේ.

## ගබ්සාව

ගබ්සාව සම්බන්ධයෙන් වන නෛතික විධිවිධාන දණ්ඩ නීති සංග්‍රහයේ 303 සිට 307 දක්වා වූ වගන්තිවලින් පෙන්වාදෙනු ලැබේ. එහි 303 වන වගන්තිය මගින් කාන්තාවක් ගබ්සා වීමට පෙළඹවීම වරදක් වන අතර, එම කොටසෙහි පැහැදිලි කිරීම මගින් තමන් විසින්ම ගබ්සා වීමට කටයුතු සිදු කරගන්නා වූ කාන්තාවක් ද මෙම වගන්තියෙහි සීමාව තුළට අයත්වන බව සඳහන් වේ. මෙම වරදට අදාල දඬුවම එකී කාන්තාව සිටින ගර්භනී අවධිය අනුව වෙනස් වන අතරඃ එය සාමාන්‍යයෙන් වසර තුනක් දක්වා සිර දඬුවමක් (සහ / හෝ දඩයක්) වන නමුදු, කාන්තාව 'දරු ප්‍රසූතියට ආසන්නව' සිටියේ නම් සිරගත කිරීමේ කාලය අවුරුදු හතක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි. ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය යටතේ ගබ්සාවට අවසර දෙන විට ඇති එකම ව්‍යතිරේකය සම්බන්ධයෙන් ද මෙම වගන්තිය මගින් විධිවිධාන පෙන්වා දෙනු ලබන අතරඃ එහි දී අදාල ක්‍රියාව ස්ත්‍රියගේ ජීවිතය බේරා ගැනීම කාර්යය සඳහා සද්භාවයෙන් කරනු ලබන ගබ්සා කිරීමක් විය යුතුය. දණ්ඩ නීති සංග්‍රහයේ 305 වන වගන්තියට

30 ඉහත එම.

31 ඉහත එම, හිංසනය වැළැක්වීම සහ ගැහැණු ළමයා සම්බන්ධයෙන් විපක්ෂයේ නායකයා විසින් පත්කළ කොමිසමේ 55 වන පිටුව

32 ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනතෙහි හි 7 වන වගන්තිය

33 ඉහත එම, හිංසනය වැළැක්වීම සහ ගැහැණු ළමයා සම්බන්ධයෙන් විපක්ෂයේ නායකයා විසින් පත්කළ කොමිසමේ 55 වන පිටුව

34 2018-03-06 දින ගන්නා ලද කැබිනට් තීරණය පිළිබඳ පුවත්පත් සාකච්ඡාව, ලබා ගත හැකිය http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=8676

අනුව, ගබ්සාවීමේ ක්‍රියාවලියේදී අදාල කාන්තාව මිය ගියහොත්, දඬුවම වසර 20 ක් දක්වා සිර දඬුවමක් දක්වා දීර්ඝ කළ හැකිය.

ගබ්සාව පිළිබඳ මෙම නීති වර්ෂ 1883 තරම් ඈත අතීතයට දිවෙන අතර දණ්ඩ නීති සංග්‍රහය බලාත්මකව පවතින පසුගිය සියවස් එකහමාරකට ආසන්න කාලයක් තුළ කිසි විටෙකත් එය සංශෝධනය කර නොමැත. එහි ප්‍රතිඵලය වන්නේ ලෝකයේ ගබ්සා කිරීම සම්බන්ධයෙන් දැඩි නීති ඇති රටවල් අතර එක් රටක් වශයෙන් ශ්‍රී ලංකාව සිටීමයි.[35] දකුණු ආසියානු කලාපයේ තත්වය හා සලකා බැලීමේ දී පෙන්නුම් කෙරෙනුයේ ඇෆ්ගනිස්ථානයෙහි සහ බංග්ලාදේශයෙහි පමණක් මෙරට හා සමාන දැඩි ගබ්සා කිරීම් පිළිබඳ නීති පවතින බවයි.[36]

මෙම සාපරාධී විධිවිධාන තිබියදීත්, දිවයින පුරා දිනකට ගබ්සාවන් 650 ක් පමණ සිදුවන බවට ගණන් බලා තිබේ.[37] ගබ්සාව අපරාධයක් වශයෙන් සංස්ථාපනය කිරීම යනු ගබ්සාවන් අපේක්ෂා කරනු ලබන කාන්තාවන් රහසිගතව මෙහෙයවනු ලබන ක්‍රියා පටිපාටීන් ඔස්සේ ගබ්සා කිරීම් සිදුකර ගැනීමට පෙළඹවීමයි. ගබ්සාවන් සිදු කිරීම නියාමනය කර නොමැති අතර ඒවා රහසිගතව සිදුවන බැවින් ඒවා ගබ්සා සිදුකරන්නන්ගෙන් එකිකොට වෙනස් වන අතර එසේ ගබ්සා සිදු කිරීම නිරන්තරයෙන් අනාරක්ෂිත වේ. ඇත්ත වශයෙන්ම, ගබ්සා කිරීම් සම්බන්ධයෙන් සිදු වන මරණ මෙරටේ මාතෘ මරණවලින් 12.5% ක් පමණ වේ.[38] ගබ්සා සිදු කිරීම් සම්බන්ධයෙන් අදාල ක්‍රියා පටිපාටි ආරක්ෂිත හා නියාමනය කළ ආකාරයකට සිදුකළහොත් මෙම මරණ සංඛ්‍යාව විශාල ලෙස අඩු කළ හැකිය.

ශ්‍රී ලංකාවේ ගබ්සාවන් සිදු කර ගැනීම අපේක්ෂා කරනු ලබන කාන්තාවන්ගෙන් බහුතරයක් දැනටමත් දරුවන් සිටින විවාහක කාන්තාවන් බව වාර්තා වේ.[39] ඒ අනුව ගත් කළ, රහසිගත ගබ්සා කිරීම් වූ කලී පවුල් සැලසුම් කිරීමේ අවාසනාවන්ත පසුබෑමකි. එබැවින්, පුළුල් ලිංගික අධ්‍යාපනය, උපත් පාලන ක්‍රම පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ එකී සේවාවන් වෙත පුළුල් ලෙස ප්‍රවේශ වීමේ හැකියාව ආදී බොහෝ කරුණු මෙරට තුළ සිදුවන ගබ්සා කිරීම් අවම කිරීම සඳහා පැවතිය යුතු අතිරේක අවශ්‍යතාවයන් වේ. මේවා සරල ප්‍රතිපත්තිමය තීරණ වන අතර ඒවා බොහෝ දුරට ධනාත්මක ප්‍රතිවිපාක ගෙන දිය හැකි නමුදු එවන් තත්වයන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට ගන්නා උත්සාහයන්ට බොහෝ විට විරෝධතාවයන් එල්ල වේ.

ගබ්සාව සම්බන්ධයෙන් පවතින නීති සංශෝධනය කිරීම සඳහා විවිධ උත්සාහයන් ගෙන ඇතත් මෙම උත්සාහයන් කිසිවක් මේ වන තෙක් සාර්ථක වී නැත. වර්ෂ 1995 දී අධිකරණ අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවේදී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලද අතර එය ගබ්සාව අපරාධයක් වශයෙන් හැඳින්වීම ලිහිල් කිරීමට උත්සාහ කළ අතර, ස්ත්‍රී දූෂණය හා ව්‍යභිචාරය හේතුවෙන් ඇති වූ ගැබ්ගැනීම් සහ ජීවිතයට නොගැලපෙන කලලරූපයේ සංජානනීය අසාමාන්‍යතා ආදී තත්වයන් සම්බන්ධයෙන්

---

35 ලෝකයේ ගබ්සා කිරීමේ නීති සැසඳීම සඳහා https://reproductiverights.org/worldabortionlaws බලන්න.

36 බංග්ලාදේශයේ ගබ්සා කිරීමේ නීති එහි 1860 දණ්ඩ නීති සංග්‍රහයේ දක්නට ලැබෙන අතර එය ශ්‍රී ලංකාවේ ගබ්සා කිරීමේ නීතිවලට බොහෝ දුරට සමාන වේ.

37 K.A.A.N තිලකරත්න, 'ශ්‍රී ලංකාවේ ගබ්සා කිරීමේ නීති ලිහිල් කිරීම; අපේක්ෂාවන් සහ අභියෝග', ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාව, විද්‍යාව සහ නීතිය, 2018 දෙසැම්බර්, වෙළුම 9, අංක 2, පිටුව 6.

38 ඉහත එම

39 දිනේෂා සමරරත්න, 'ගබ්සා කිරීමේ විවාදය: නොගැලපීම සහ අස්ථානගත වීම', ග්‍රවුන්ඩ්වීව්ස්, 2017 සැප්තැම්බර්.https://groundviews.org/2017/09/13/the-abortion-debate-mismatched-and-misplaced/

ගබ්සාව සිදු කිරීමට ඉඩ ලබා දීම එමගින් අපේක්ෂා කරන ලදි.[40] වර්ෂ 2013 දී ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් තවත් උත්සාහයක් ගනු ලැබුවද, මෙයද කිසිදු සාර්ථකත්වයක් කරා ළඟා නොවීය.[41]

නීති කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද සංශෝධන මඟින් ස්ත්‍රී දූෂණය සහ භ්‍රෑණ ආබාධිත තත්වයන් සම්බන්ධයෙන් වන සීමිත හේතු මත ගබ්සාව සිදු කිරීම අපරාධයක් වශයෙන් හඳුනා නොගැනීමට ඉඩ ප්‍රස්ථාව නිර්මාණය කිරීමේ හැකියාව පැවතුනි. එකී යෝජිත සංශෝධනවල ව්‍යභිචාරයට අදාල සිද්ධීන් ඇතුළත් නොවූ අතර ඊට හේතුව වූයේ, සමහර අවස්ථාවන් හි දී ව්‍යභිචාරය කැමැත්තෙන් විය හැකි බවට කොමිසම තීරණය කිරීම සහ, ඉහත කී අන්දමට ගබ්සාව සඳහා ඉඩ ලබා දෙන යෝජිත අවසර ලත් කාණ්ඩ දෙකෙන් එකකට එය අන්තර්ගත වුවහොත් අදාල ගැබ් ගැනීම ඉවත් කළ හැකි තත්වයක් උද්ගත විමේ ඉඩ ප්‍රස්ථාව නිසාවෙනි. සාමාන්‍යයෙන් සිදුවන ගබ්සාවන්ගෙන් බහුතරයක් පවුල් සැලසුම් කිරීමේ මාධ්‍යයක් ලෙස විවාහක කාන්තාවන් විසින් අපේක්ෂා කරනු ලබන තත්වය සලකා බලන විට, මෙම සීමිත අවස්ථාවන්හිදී පමණක් ගබ්සාව සිදු කිරීම අපරාධයක් වශයෙන් හඳුනා නොගැනීමෙන් පමණක් වර්තමාන සමාජයේ ඒ සම්බන්ධයෙන් ඇති අවශ්‍යතා සපුරාලනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය.[42] ගබ්සාව සිදු කිරීම සම්බන්ධයෙන් වන නෛතික සංශෝධන ඔස්සේ සැබෑ බලපෑමක් ඇති කිරීම සඳහා ගබ්සාව සිදු කිරීම අපරාධයක් වශයෙන් හඳුනා නොගැනීමේ අවස්ථාවන් සමගම උපත් පාලන ක්‍රම සම්බන්ධයෙන් නිසි දැනුමක් ලබා දීමත්, එකී දෑ වෙත පහසුවෙන් ප්‍රවේශ වීමේ ඉඩ ප්‍රස්ථාව සැලසීමත් සඳහා අවැසි පියවර ගැනීම අවශ්‍ය වේ.

මෙකී විෂය කාරනය සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිසංස්කරණයේ අසාර්ථකත්වයන් පැවතියද, මෙම සංශෝධන සිදුවිය යුතු වීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් පිළිගැනීමක් තිබේ. වර්ෂ 2011-2016[43] මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මට 'ව්‍යභිචාරය, ස්ත්‍රී දූෂණය සහ ප්‍රධාන සංජානන අසාමාන්‍යතා සම්බන්ධයෙන් ගැබ් ගැනීම් වෛද්‍යමය වශයෙන් අවසන් කිරීම අපරාධයක් ලෙස හඳුනා නොගැනීම' යන අරමුණු ඇතුළත් විය. කෙසේ නමුත්, එකී සැලැස්මේ ඉලක්කගත කාල පරාසය අවසන් වන විට ද පෙර කී ඉලක්කය සාක්ෂාත් කරගැනීමට හැකියාවක් නොලැබුණි. වර්ෂ 2017 - 2021 සඳහා වූ සැලැස්මට ද ඒ හා සමාන ඉලක්කයක්[44] ඇතුළත් වූ නමුත්, සැලැස්ම බලාත්මක වූ දා සිට රජයේ වෙනසක් සිදුවී ඇති හෙයින්, වත්මන් රජය ද ඒ සඳහා කැපවී සිටී දැයි නොදනී.

වෛද්‍ය වෘත්තිකයින්ගේ භාවිතය සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පශ්චාත් ගබ්සාව පිළිබඳව වර්ෂ 2015 ජාතික මාර්ගෝපදේශ මඟින් පෙන්වා දී ඇත්තේ නීතිවිරෝධී ගබ්සා කිරීම් පිළිබඳ සිද්ධීන් බලධාරීන්ට වාර්තා කිරීමට වෛද්‍ය වෘත්තිකයන් රාජකාරීමය වශයෙන්

40 ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව, 'ගර්භණීභාවය අවසන් කිරීම - ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාවේ යෝජනා', 2013 පෙබරවාරි, පිටුව 2. ලබා ගත හැකිය http://lawcom.gov.lk/web/images/stories/reports/medical_termination_of_pregnancy_proposals_of_the_law_commission_of_sri_lanka.pdf

41 ඉහත එම.

42 ඉහත එම, දිනේෂා සමරරත්න, 'ගබ්සා කිරීමේ විවාදයː නොගැලපීම සහ අස්ථානගත වීම'

43 https://www.refworld.org/pdfid/5a842f057.pdf ලබා ගත හැකිය.

44 https://www.stopchildcruelty.com/media/doc/1554788053.pdf ලබා ගත හැකිය.

බැඳී නොසිටින බවයි.[45] කිසිදු කාන්තාවක් සඳහා දෙවරක් මෙම ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට සිදු වීම වැලැකවීමට වගබලා ගැනීම සඳහා පවුල් සැළසුම් පිළිබඳ අධ්‍යාපනය පශ්චාත් ගබ්සා සම්බන්ධයෙන් වන ප්‍රතිකාර සඳහා ඇතුළත් කිරීමට අදාල මාර්ගෝපදේශ ඔස්සේ විධිවිධාන සලසා තිබේ.

ශ්‍රී ලංකාවේ නීතිවිරෝධී ගබ්සාවන් අපේක්ෂා කරන බොහෝ කාන්තාවන් විවාහක තැනැත්තන් වන බව සලකන විට, විවාහ වන අවස්ථාවේ දී මෙන්ම, ඉන් පසුව සෑම දරුවෙකුම උපත ලැබීමෙන් පසුව පවා, විවිධ උපත් පාලන ක්‍රම පිළිබඳව කාන්තාවන් සහ පිරිමින් දැනුවත් කරනු ලැබීම ඉතා වැදගත් වේ. උපත් පාලන ක්‍රම ලබා ගැනීමට හෝ මිලදී ගැනීමට ඔවුන්ට හැකි ස්ථානය ඇතුළුව අලුත විවාහ වූ යුවළයන්ට ඒ සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු ඇතුළත් පැකේජයක් ලබා දීමේ වැඩසටහනක් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් දැනටමත් ආරම්භකර තිබේ.[46] කොළඹ දිස්ත්‍රික්කයේ විවාහක යුවළයන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා මගින් පැහැදිලි වූයේ විවාහ රෙජිස්ට්‍රාර් විසින් ලබා දුන් පත්‍රිකාවක උපත් පාලන ක්‍රම පිළිබඳ තොරතුරු අඩංගුව පැවති බවයි. සියලුම විවාහක යුවළයන්ට එවැනි තොරතුරු විවාහය සිදුවන අවස්ථාවේ දී ලබා දීම සහතික කිරීම වැදගත්ය. මෙය පාසල්වල අනිවාර්ය හා පුළුල් ලිංගික අධ්‍යාපනයක් හා සමගාමීව ද සිදු කළ යුතුය.

[45] පශ්චාත් ගබ්සාව පිළිබඳ ජාතික මාර්ගෝපදේශ, දෙවන සංස්කරණය, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, 2015, පිටුව 73, ලබා ගත හැකිය. http://fhb.health.gov.lk/images/FHB%20resources/Family%20Planning/Family%20Planning%20Unit/Publications /National%20Guidelines%20on%20Post%20%20%20Abortion%20Care.pdf

[46] සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, 'අලුත විවාහ වූ යුවළයන් සඳහා සේවා පැකේජය ලබා දීම සඳහා මාර්ගෝපදේශ', අංක 02-68 / 2018 යන සාමාන්‍ය චක්‍රලේඛ ලිපිය ලබා ගත හැකිය. https://drive.google.com/file/d/1Q2IpsbiTxcitxV4F7wEmPoGGZWVJI6f1/view

## 2. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට ප්‍රතිචාර නොදක්වන අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියක්

වාර්තාවෙහි මෙම කොටස ඔස්සේ ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය දෙස පුළුල් ලෙස සොයා බලන අතර එහිදී ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කාන්තාවන්ට සිදුවන හිංසනයෙහි වින්දිතයින් සම්බන්ධයෙන් ප්‍රතිචාර නොදක්වන තත්වයන් ගණනාවක් හඳුනා ගනී. එසේ තිබියදී, එය අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ යුක්තිය පසිඳලීම පවත්වාගෙන යාම වූ කලී ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කාන්තාවන්ට සිදුවන හිංසනයෙහි බොහෝ වින්දිතයින් සම්බන්ධයෙන් ප්‍රායෝගික නොවන සහ නුසුදුසු තත්වයක පවතින අතර එමගින් ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳ ව්‍යාප්තිය හා ආයතනික උදාසීනත්වය තවදුරටත් තහවුරු වේ.

### නඩු කටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් වන දීර්ඝ කාලීන ප්‍රමාදයන්

ශ්‍රී ලංකාවේ සමස්ථ අධිකරණ පද්ධතියෙහි සියලු මට්ටම් ප්‍රමාදයන්ගෙන් පිරී තිබේ. මෙමගින් සියලු පුරවැසියන්ට විශාල අසාධාරණයක් හා අපහසුතාවයක් ඇති කරන අතර, විශේෂයෙන්ම එය ශාරීරිකව, මානසිකව හා ආර්ථික වශයෙන් අනන්ත වූ ප්‍රතිවිපාකයන්ට ජීවිත කාලය පුරාවටම මුහුණ දෙන ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනයෙහි වින්දිතයින් කෙරෙහි අහිතකර ලෙස බලපායි.

වර්ෂ 2012 සහ 2019 යන කාල පරාසය අතර අභියාචනාධිකරණය විසින් ස්ත්‍රී දූෂණයට අදාළව තීරණය කර ප්‍රකාශයට පත්කළ විනිශ්චයන් 16 ක් (අහඹු ලෙස තෝරාගෙන ඇත) සම්බන්ධයෙන් තොරතුරු පහත වගුව 1 මඟින් විශ්ලේෂණය කරනු ලැබේ. මෙම විශ්ලේෂණ මඟින් පැහැදිලි වන්නේ සාමාන්‍යයෙන් අදාල සිදුවීමේ සිට ඒ සම්බන්ධයෙන් වන අධිකරණමය කටයුතු නිමා වීම සඳහා සාමාන්‍යයෙන් අවුරුදු දහයකට වඩා වැඩි කාලයක් ගත වන බවයි. අපරාධයක වින්දිතයකු බවට පත් වූ ඕනෑම තැනැත්තකුට අධිකරණ පද්ධතිය ප්‍රතිචාර දැක්වීමට මෙවන් වූ දීර්ඝ කාලයක් ගතවන තෙක් බලා සිටීමට සිදුවීම පිළිගත නොහැකි දීර්ඝ කාලීන ප්‍රමාදයක් වන අතර, එමගින් වින්දිතයින්ට නොනිම් කාලයක් පුරාවට ඔවුන්ගේ දුක් වේදනා විඳීම ද දීර්ඝ කාලීනව සිදු වේ. එබැවින්, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනය ආශ්‍රිත නඩු කටයුතු සඳහා කඩිනම් ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

| නඩු අංකය සහ නඩු වර්ගය | සිදුවීම (සිදුවීම්) සිදුවූ දිනය | අභියාචනාධිකරණයේ විනිශ්චය දිනය | ගත වූ කාලය | වින්දිතයාගේ නම සඳහන් කර තිබේද? |
|---|---|---|---|---|
| CA 13/2017 ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | 2004 පෙබරවාරි 1 - මාර්තු 26 | 2017 දෙසැම්බර් 14 | අවුරුදු 10 කට වඩා | ඔව් |
| CA 25/09 ස්ත්‍රී දූෂණය | 1999 මැයි 27 | 2014 මාර්තු 6 | අවුරුදු 10 කට වඩා | ඔව් |
| CA 105/2010 ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | සඳහන් කර නැත. 2007 දී මහාධිකරණ නඩුව ගොනුකර ඇත. | 2017 දෙසැම්බර් 12 | අවම වශයෙන් අවුරුදු 10 ක් | ඔව් |

| | | | | |
|---|---|---|---|---|
| CA 44/2014 ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | සඳහන් කර නැත. 2012 දී මහාධිකරණයේ අධිචෝදනා ගොනුකර ඇත. | 2019 මාර්තු 6 | අවම වශයෙන් අවුරුදු 7 ක් | ඔව් |
| CA 187/2013 ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | 2003 සැප්තැම්බර් 28 | 2017 ජුනි 14 | අවුරුදු 15 කට ආසන්න කාලයක් | ඔව් |
| CA 21/12 ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | 1999 සැප්තැම්බර් 24 | 2015 ජූලි 16 | අවුරුදු 15 කට වඩා | ඔව් |
| CA 285/2017 ස්ත්‍රී දූෂණය | 2005 නොවැම්බර් 7 | 2019 ජනවාරි 28 | අවුරුදු 15 කට ආසන්න කාලයක් | ඔව් |
| CA 210/2013 ස්ත්‍රී දූෂණය | 2001 මැයි 28 | 2016 නොවැම්බර් 30 | අවුරුදු 15 කට වඩා | ඔව් |
| CA 270/2015 ස්ත්‍රී දූෂණය | සඳහන් කර නැත. 2006 දී මහාධිකරණ නඩුව ගොනුකර ඇත. | 2017 සැප්තැම්බර් 15 | අවුරුදු 10 කට වඩා | ඔව් |
| CA 06/2013 ස්ත්‍රී දූෂණය | 2001 ජනවාරි 1 - ජූලි 31 | 2014 ජූලි 15 ( වරදක් සිදු වූ විට වින්දිතයාට අවුරුදු 13 ක් සහ මහාධිකරණයේ සාක්ෂි දෙන විට අවුරුදු 20 ක මවක් විය) | අවුරුදු 10 කට වඩා | ඔව් |
| CA 196-200/2011 | සඳහන් කර නැත. 2006 දී මහාධිකරණ නඩුව ගොනුකර ඇත. | 2014 පෙබරවාරි 7 | අවම වශයෙන් අවුරුදු 8 ක් | ඔව් |
| CA 249/2010 | සඳහන් කර නැත. 2005 දී මහාධිකරණ නඩුව ගොනුකර ඇත. | 2013 මාර්තු 4 (නැවත නඩු විභාගය සඳහා නියම කරන ලදි) | නැවත නඩු විභාගයට අවම වශයෙන් අවුරුදු 8 කට පෙර | ඔව් |
| CA HCC 116/15 ස්ත්‍රී දූෂණය | සඳහන් කර නැත. 2011 දී මහාධිකරණ නඩුව ගොනුකර ඇත. | 2019 අගෝස්තු 30 | අවම වශයෙන් අවුරුදු 8 ක් | නැත |
| CA 176/2013 | 2000 ජනවාරි 1 - පෙබරවාරි 29 | 2014 නොවැම්බර් 7 | අවුරුදු 15 කට ආසන්න කාලයක් | ඔව් |
| CA 378/2017 | 2011 (දිනය නිශ්චිතව දක්වා නැත) | 2019 සැප්තැම්බර් 3 | අවම වශයෙන් අවුරුදු 8 ක් | නැත |
| CA 148/2016 සමූහ දූෂණය | 2009 ජූලි 21 | 2019 පෙබරවාරි 8 | අවුරුදු 10 කට ආසන්න කාලයක් | ඔව් |

*වගුව 1*

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනය ආශ්‍රිත නඩු කටයුතු කඩිනම් කිරීම සඳහා විකල්ප අවස්ථාවන් ලෙස පෙන්වා දිය හැකි විශේෂිත ප්‍රතිසංස්කරණ ද්විත්වයක් වන්නේ:

i. ***ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳ නඩු කටයුතු මෙහෙය වීම සඳහාම විශේෂ මහාධිකරණ*** - යම් යම් ප්‍රශ්නකාරී තත්වයන් සම්බන්ධයෙන් වන විශේෂිත නඩු සඳහා වෙන් කර ඇති විශේෂ මහාධිකරණ දැනටමත් ශ්‍රී ලංකාවේ නඩු විභාග කිරීම ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා නිදර්ශනයක් වන්නේ දූෂණ පිළිබඳ නඩු සඳහා එවන් අධිකරන පිහිටු වීම පෙන්වා දිය හැකි අතර ඒ අනුව ලිංගිකත්වය

සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳ විශේෂ මහාධිකරණ පිහිටුවීම සඳහා දැනටමත් පූර්වාදර්ශයක් එමඟින් ස්ථාපිත වී තිබේ.

ii. ***නීතිපති දෙපාර්තමේන්තුව තුළ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳ විශේෂිත ඒකකයක්*** - ළමා අපයෝජනයට අදාළ නඩු කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා විශේෂිත ළමා ආරක්ෂණ ඒකකයක් නීතිපති දෙපාර්තමේන්තුව තුළ දැනටමත් පිහිටුවා ඇත. මෙම ඒකකය වර්ෂ 2012 දී දියත් කළ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.[47] නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂඥ නීතීඥයින් විසින් එය මෙහෙයවනු ලබන අතර, කඩිනමින් නඩු නිගමනය කිරීම සඳහා අදාළ අපරාධ යුක්ති විනිශ්චය ආයතනවල සියලු ක්‍රියාකාරිකයන් විසින් වඩාත් හොඳින් එකට එක්ව කටයුතු කළ යුතුය.

## වින්දිතයා සහ සාක්ෂිකරුවා ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රමවේදයක් නොපැවතීම

අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය සාර්ථක වීමට නම්, සාක්ෂිකරුවන්ට ඉදිරියට පැමිණ ඔවුන්ට සිදුවූ දේ වාර්තා කිරීමට හැකි විය යුතු අතර, සාක්ෂිකරුවන්ට තමන් දන්නා දේ සම්බන්ධයෙන් සාක්ෂි දීමට හා එකී තොරතුරු බෙදා ගැනීමට හැකි විය යුතුය. එකී පද්ධතිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක වීමට නම් පළිගැනීම්වලට බිය නොවී වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට එය කළ හැකි විය යුතුය. ඒ මන්ද යත්, එවන් මැදිහත් වීමක ප්‍රතිඵලයක් වශයෙන් වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ස්වභාවිකවම ඔවුන්ගේ ආරක්ෂාව හා ඔවුන්ට සමීප පුද්ගලයින්ගේ ආරක්ෂාව අනතුරට ලක් වීමේ අවධානමක් පවතී නම් එහි දී ඔවුන් ඉදිරිපත් වීමට අකමැති වනු ඇත.

ඉහත කී තත්වයට ප්‍රතිකර්මයක් වශයෙන් වර්ෂ 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කරන ලදි.[48] මෙම පනත මඟින් අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇති අතර අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට සහන සැලසීම සඳහා විධිවිධාන ගණනාවක් එහි අන්තර්ගත වේ. කෙසේ නමුත්, මෙම පනත සම්පූර්ණයෙන් හා ඵලදායී ලෙස ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් දැනටමත් විවිධ විවේචනයට ලක්ව ඇත.[49]

මෙකී පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ගැටළුකාරී තත්වයන් කිපයක් වන්නේ, අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පැවැත්ම සහ ඒ යටතේ ඔවුන්ට ලැබිය යුතු ආරක්ෂාව පිළිබඳව සාමාන්‍ය ජනතාව නොදැන සිටීම; අධිකාරියට කරන ලද පැමිණිලි විමර්ශනය කිරීමේ දී පවතින මන්දගාමී ප්‍රගතිය; පුහුණු කාර්ය මණ්ඩලයේ හිඟකම; සහ

---

47 'ළමා අපයෝජන සිද්ධීන් කඩිනමින් සැකසීම සඳහා දියත් කරන ලද ජාතික ව්‍යාපෘතිය', ඩේලිඑෆ්ටී, 2012 සැප්තැම්බර් 5, ලබා ගත හැකිය http://www.ft.lk/news/national-project-launched-for-expeditious-processing-of-child-abuse-cases/56-107720

48 https://www.lawnet.gov.lk/act-no-4-of-2015/ ලබා ගත හැකිය.

49 එස්තර් හූල්, වින්දිතයා සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ සංක්‍රාන්ති යුක්තිය: හදිසි ප්‍රතිසංස්කරණ සඳහා අත්‍යවශ්‍ය අවශ්‍යතාවය, ග්‍රවුන්ඩ් වීව්ස්, 2016 ජනවාරි 14, බලන්න. https://groundviews.org/2016/01/14/victim-and-witness-protectionand-transitional-justice-the-imperative-need-for-urgent-reform/

අධිකාරියට ලබා දී ඇති ආයතනික ස්වාධීනත්වයේ ප්‍රමානවත් නොවීම ආදියයි.[50] අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2018 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාවට අනුව, වර්ෂ 2016 සිට 2018 දක්වා කාලය තුළ අධිකාරිය යටතේ ඇති ආරක්ෂක අංශයට ලැබී ඇත්තේ ආරක්ෂාව සැපයීම සඳහා ඉල්ලීම් හතක් පමණි (2016 සහ 2017 දී එක් අයෙකු සහ 2018 දී පහක්).[51] මෙම අංශය ඇත්ත වශයෙන්ම වසර තුනක් ඇතුළත ආරක්ෂාව සපයා ඇත්තේ පුද්ගලයන් හය දෙනෙකුට පමණක් වේ.[52]

අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනුව, දැනුවත්භාවය නොමැතිකම අධිකාරියේ සාර්ථකත්වයට බාධාවක් වී ඇති එක් සාධකයක් වන අතර, බොහෝ වින්දිතයින්, විශේෂයෙන් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනයට ගොදුරු වූවන්, බිය, ලැජ්ජාව හෝ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය කෙරෙහි ඇති බලාපොරොත්තු සුන්වීම හේතුවෙන් අපරාධ සම්බන්ධයෙන් වාර්තා නොකිරීමට තීරණය කරයි.[53] කෙසේ නමුත්, අවශ්‍යතාව සපුරාලීම සඳහා එකී ආයතන ව්‍යුහයෙහි ධාරිතාවය ගොඩනංවන තුරු අධිකාරියට ප්‍රසිද්ධිය ලබා දීම ප්‍රමාණවත් නොවන බව ද පෙන්වා දී තිබේ.[54]

ආරක්ෂාව සඳහා වන ඉල්ලීම් පිළිබඳව ක්ෂණිකව විමර්ශනය කිරීමට අවශ්‍ය ක්‍රියා පටිපාටිවලට ඉඩ දීම අත්‍යවශ්‍ය වන අතර එසේ නොවුන හොත් ඒ සම්බන්ධයෙන් වන ප්‍රමාදයන් ඔස්සේ ආරක්ෂාව සඳහා ඉල්ලීම් සිදු කිරීම නිරර්ථක දෙයක් වනු ඇත. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට සිදුවන හිංසනයට අදාල සිදුවීම් වාර්තා කළහොත් එකී අධිකාරිය මගින් තමන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දෙනු ඇතැයි විශ්වාස කිරීමට නම් මෙකී පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක වන ආකාරය ජනතාව දැක ගත හැකි විය යුතුය.

## ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයෙහි වින්දිතයින් සඳහා වන අධිකරණ සහභාගීත්ව රීතීන්හි ප්‍රමාණවත් නොවන බව සහ පරස්පරතාවය

1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත මගින් ළමා අපයෝජන සම්බන්ධයෙන් වන අවස්ථා වලදී, එකී කටයුතුවලට අදාල ක්‍රියාපටිපාටියෙහි දී ප්‍රශ්නගත කරුණු හා සම්බන්ධ තත්වයක දී දරුවාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නඩුවේ විත්ති පාර්ශවයට අවස්ථාවක් ලබා දෙන්නේ නම් දරුවෙකු සමග මූලික සම්මුඛ සාකච්ඡාවේ වීඩියෝ පටිගත කිරීමක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ හැකි බව

50 මනේෂ්කා බෝර්හැම්, 'සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය: වසර තුනකට පසු තවමත් පසුබසිමින් සිටී', සන්ඩේ ඔබ්සර්වර්, 2019 පෙබරවාරි 24, ලබා ගත හැකිය. http://www.sundayobserver.lk/2019/02/24/news-features/witness-protection-authority-stillfaltering-after-three-years

51 අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, කාර්ය සාධන වාර්තාව, 2018, පි 105, ලබා ගත හැකිය https://www.moj.gov.lk/web/images/pdf/progress_report/2018/English.pdf

52 ඉහත එම, මැනේෂ්කා බෝර්හැම්, 'සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය: අවුරුදු තුනකට පසු තවමත් පසුබසිමින් සිටී'.

53 "අපරාධයක් වාර්තා කිරීමට කිසි විටෙකත් පසුබට නොවන්න" යැයි 2020 ජනවාරි 17 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අපරාධ හා අපරාධ යුක්තිය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් උදයකුමාර අමරසිංහ මහතා පවසයි. http://fhss.sjp.ac.lk/criminology/2020/01/17/never-hesitate-to-report-a-crime-says-udayakumara-amarasinghedirector-general-of-napvcd/

54 අනුරංගි සිං, 'සාක්ෂි ආරක්ෂණ අධිකාරිය අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ අඛණ්ඩතාව සඳහා ප්‍රධාන අංගයකි', ඉරිදා ඔබ්සර්වර්, 2018 සැප්තැම්බර් 30, ලබා ගත හැකිය https://www.sundayobserver.lk/2018/09/30/news-features/witness-protectionauthority-%E2%80%98key-integrity-criminal-justice-system%E2%80%99

විධිවිධාන සලසා තිබුණි.[55] අපයෝජනයට ලක් වූ හෝ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසන වලට ගොදුරු වූ වැඩිහිටියන් සම්බන්ධයෙන් මෙකී විධිවිධාන අදාළ නොවේ.

අධිකරණ කටයුතුවලට පෞද්ගලිකව සහභාගී වීම සම්බන්ධයෙන් ගත් කල, මහාධිකරණයේ ලිඛිතව නොමැති සාමාන්‍ය පිළිවෙත නම්, කිසියම් ලිංගික වරදකට ගොදුරු වූ තැනැත්තාගේ වයස කුමක් වුවත් එවන් කරුණක් විමර්ෂණය කරනු ලබන කල්හි මහජනයාට අධිකරණ කාමරයේ රැඳී සිටීමට ඉඩ නොදීමයි.[56] වින්දිතයාගේ කැමැත්ත හෝ පවතින අවශ්‍යතාවය මත පදනම්ව ඉල්ලීමක් ඇති විට දී, වින්දිතයා පිළිබඳ එවැනි විමර්ෂණයක් විනිසුරුවරයාගේ නිල කාමරය තුළද සිදුවිය හැකිය. කෙසේ වෙතත්, යුක්තිය උදෙසා සහ චූදිතයාට සාධාරණ නඩු විභාගයක් ලබා දීම උදෙසා, එවැනි සාක්ෂි මෙහෙයවීමක දී චූදිතයාට සහ ඔවුන්ගේ නීතිඥයින්ට පෙනී සිටීමට සිදුවනු ඇත.

මෙම ක්‍රියාව පරිචයක් වශයෙන් ගත්කළ ප්‍රශංසනීය වුවත්, එවැනි ක්‍රියා පටිපාටියක් නීතිගත කිරීමෙන් ඒ සම්බන්ධයෙන් පැවතිය හැකි ඕනෑම අපැහැදිලි බවක් නැති වී යන අතර, අධිකරණයන් තුළ පරස්පර ලෙස ක්‍රියාත්මක වන පරිචය ද ඉවත් කරනු ඇත. අපරාධවලට ගොදුරු වූවන්ගේ අවශ්‍යතා සඳහා රජය දක්වන කැපවීම ද එයින් විද්‍යමාන වනු ඇත.

## නොගැලපෙන දඬුවම් පිළිබඳ මාර්ගෝපදේශයන්

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසන ක්‍රියා කරනු ලබන වැරදිකරුවන්ට ලබා දී ඇති දඬුවම් වල පැවතිය යුතු නිශ්චිත ඒකමතික ස්වභාවය සම්බන්ධයෙන් ගැටළු පවතී. දඬුවම් නියම කිරීමේදී ඒ සම්බන්ධයෙන් මාර්ගෝපදේශයන් පවතින විට එකී දඬුවම්වල ඒකමතික ස්වභාවයක් ඇති බව සහතික කරනු ඇති අතර, විනිසුරුවන් සහ නඩු පවරන්නන් අදාළ නොවන සාධක වලට බැදීමක් ඇති නොවීම හෝ වැදගත් සාධක නොසලකා හැරීමට ඉඩ ප්‍රස්ථාවක් ඇති වීම වළකාගත හැකි වනු ඇත. වරදකරුට ලබා දී ඇති දඬුවම ඒ ඒ විනිසුරුවරයාගේ පෞද්ගලික අදහස් මත රඳා පැවතිය යුතු නොවේ. එක්සත් රාජධානියෙහි තත්වය සම්බන්ධයෙන් බලන කල, ලිංගික අපරාධවලට දඬුවම් නියම කිරීමේදී විනිසුරුවන් විසින් සලකා බැලිය යුතු පුළුල් මාර්ගෝපදේශයන් දඬුවම් කවුන්සිලය විසින් කෙටුම්පත් කර ඇත.[57] එක් එක් වර්ගයේ වරදක් සඳහා අනුගමනය කළ යුතු පියවරෙන් පියවර අනගමනය කළයුතු රීතියක් එකී මාර්ගේපදේශයට ඇතුළත් වන අතර, හානිය සිදු වූ ප්‍රමාණය මත පදනම්ව වරද වර්ගීකරණය කිරීමේ සිට විවිධ ප්‍රතිකර්මයන්ට අදාල සාධක සලකා බැලීම දක්වා වූ පරාසයක් එකී කරුණු මඟින් ආවරනය වේ. එවන් තත්වයක දී වුවද විනිසුරුවන් වෙත යම් අභිමතයක් භාවිත කිරීමේ හැකියාව පවතින අතර, එවන් අභිමතයක් හුදෙක් පවතින සිද්ධිමය සාධක මත පදනම්ව

55 සාක්ෂි ආඥාපනතට 163 ඒ වගන්තිය හඳුන්වා දී ඇති පනතේ 4 වන වගන්තිය. ලබා ගත හැකි පනත https://www.lawnet.gov.lk/evidence-special-provisions-3/

56 ස්වාෂා ප්‍රනාන්දු සහ සජිත් බන්ඩාරා, 'අපරාධ සහ සාක්ෂිකරුවන්ගේ වින්දිතයින් ආරක්ෂා කිරීම: සමකාලීන නීති යෙදුමක්', කනිෂ්ඨ නීති නීති සඟරාව (2019), X වෙළුම, http://www.juniorbarbasl.lk/assets/files/Article%20by%20Swasha%20Fernando%20and%20Sajith%20Bandara%20%20PROTECTION%20OF%20VICTIMS%20OF%20CRIME%20AND%20WITNESSES%20%20A%20CONTEMPORANEOUS%20APPLICATION%20OF%20LAWS.pdf

57 ලිංගික අපරාධ - නියත මාර්ගෝපදේශය, දඬුවම් කවුන්සිලය, එක්සත් රාජධානිය, 2003, ලබා ගත හැකිය https://www.sentencingcouncil.org.uk/wp-content/uploads/Sexual-offences-definitive-guideline-Web.pdf

සීමිත පරාසයක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතුය. ඒ හා සමාන මාර්ගෝපදේශයක් ශ්‍රී ලංකාවට සුදුසු වනු ඇත.

## ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනයට පාත්‍රවන වින්දිතයින්ගේ නම් වාර්තා වීම

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසන වලට ගොදුරු වූවන්ට ඔවුන්ගේ ජීවිත සමඟ ඉදිරියට යාම සඳහා හෝ ඔවුන් යථා තත්ත්වයට පත්වීම සඳහා ඔවුන් මුහුණ දුන් කම්පනයෙන් මිදීමට හැකි වීම වැදගත් ය. විශේෂයෙන් වින්දිතයින්ට බොහෝ අපකීර්තියක් ඇති රටක, ඔවුන්ගේ අනන්‍යතාවය ඔවුන් වින්දිතයකු වීමේ තත්වය හා සම්බන්ධ නොකළ යුතුය. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ වර්තමාන ඩිජිටල් යුගයේදී මිනිසුන්ට අන්තර්ජාලය හරහා ඕනෑම කෙනෙකුගේ නම පහසුවෙන් සොයා ගත හැකි අතර ඔවුන් පිළිබඳ විස්තර සොයා ගත හැකි නිසාවෙනි. අනාගත සේවා යෝජකයන්, වීසා සම්බන්ධ නිලධාරීන් හෝ තම සහකරුවන් ඇතුළු ඕනෑම පුද්ගලයෙකුට 'ගූගල් සෙවීම' කළ හැකි අතර ඒ ඔස්සේ වින්දිතයකුගේ අනන්‍යතා ප්‍රකාශයට පත් කර ඇත්නම් ඔවුන් එකී තොරතුරු සමඟ සම්බන්ධ වනු ඇත.

දණ්ඩ නීති සංග්‍රහයේ 365 ඇ වගන්තිය යටතේ, ස්ත්‍රී දූෂණයට, ලිංගික අතවර කිරීමට, බරපතල ලිංගික අපයෝජනය කිරීමකට, ව්‍යභිචාරයට සහ වෙනත් ලිංගික වරදවල් කීපයකට ලක්වූවෙකුගේ නම හෝ ඒ තැනැත්තාගේ අනන්‍යතාවය, පොලිසියෙහි උපදෙස් පරිදි; වින්දිතයාගේ අවසරය ඇතිව; හෝ ඔවුන් මියගිය හෝ ආබාධිත වූ අවස්ථාවක දී ඔවුන්ගේ ළඟම ඥාතියා/භාරකරු විසින් ලිඛිත අවසරය ලබාදුන් අවස්ථාවක හැර, හෙළිදරව් වන යම් කාරණයක් මුද්‍රණය කිරීම හෝ පළ කිරීම කරනු ලබන කවර හෝ තැනැත්තකු වරදක් කරන බව සඳහන් වේ.[58] මේ අතර, එවැනි නඩු වලදී අධිකරණ කටයුතුවලට අදාළ කරුණු අධිකරණයේ අවසරයකින් තොරව ප්‍රකාශයට පත් කිරීම නීති විරෝධී ය. එසේ කරන ඕනෑම පුද්ගලයෙකුට වසර දෙකක් දක්වා සිරගත කළ හැකිය. ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනතෙහි මීට සමාන ප්‍රතිපාදන අඩංගු වේ.[59]

කෙසේ වෙතත්, 365ඇ වගන්තිය ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ තීන්දු මුද්‍රණය කිරීමට හෝ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ගත්කල එවැනි බාධාවක් අදාළ නොවේ. මෙම වාර්තාවෙන් විශ්ලේෂණය කරන ලද ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් අභියාචනාධිකරණ නඩු 16 අතුරින් (ඉහත වගුව 1 බලන්න), අදාල අපරාධයන්ට ගොදුරු වූ 14 දෙනකුගේ නම් සඳහන් කර ඇති අතර යම් යම් අවස්ථාවන්හි දී අදාල වින්දිතයන් එකී වරද සිදුවන අවස්ථාවේ දී බාලවයස්කාර තත්වයෙහි පසු වුවද එලෙස අනන්‍යතාවයන් හෙළි වී ඇත. අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු සියල්ලම මාර්ගගතව ප්‍රකාශයට පත් කර ඇති අතර, බොහෝ අවස්ථාවලදී වින්දිතයාගේ නම අන්තර්ජාලයෙහි සෙවුම් යන්ත්‍රවල සෙවූ විට, ඔවුන්ගේ ස්ත්‍රී දූෂණ සිදුවීම් සම්බන්ධ විස්තර කරන අදාළ විනිශ්චයන් පෙන්නුම් කරන ලදී. බොහෝ අවස්ථාවන්හීදී වින්දිතයාගේ සම්පූර්ණ නම භාවිතා කරන ලද අතර ඒවා පහසුවෙන් හඳුනාගත හැකිය. දණ්ඩ නීති සංග්‍රහයේ මෙකී විධිවිධානය වර්ෂ 1995 දී හඳුන්වා දෙන ලද අතර, එම කාලය තුළ අන්තර්ජාලය හරහා නමක් සම්බන්ධ වාර්තා සෙවීමේ

58 365ඇ වගන්තිය, දණ්ඩ නීති සංග්‍රහය.
59 20 වන වගන්තිය

මෙතරම් පහසුවක් පැවතිය හැකි බවට සිතාගත නොහැකි තත්වයක් පැවැතුනි. ඒ හේතුවෙන් වර්තමානයෙහි විකාශනය වන අවශ්‍යතාවන්ට අනුවර්තනය වීම සඳහා නීතියෙහි කඩිනම් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

නඩුවක විනිශ්චයේ දී වින්දිතයාගේ නම සඳහන් කළ යුතු බවට කිසිදු හේතුවක් නැති අතර, එය ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ද සාධාරණීකරණය කිරීමක් නැත. පුද්ගලිකත්වයට ඇති අයිතිය ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකමක්[60] ලෙස තවමත් හඳුනාගෙන නොමැති අතර, අපරාධයන්ට ගොදුරු වූ තැනැත්තන්ට ඔවුන් මුහුණ දුන් සිදුවීමේ කම්පනයෙන් මිදීමට ඔවුන්ට ඉඩ සැලසීම සඳහා ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම වැදගත් ය.

## ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනයට ගොදුරු වූවන් සඳහා ප්‍රමාණවත් 'එක්-නැවතුම් මධ්‍යස්ථාන' නොමැති වීම

අපයෝජනයට හා ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ බොහෝ දෙනෙක් යා යුත්තේ කොතැනටද සහ ඔවුන්ට උපකාර ලබා ගන්නේ කෙසේද යන්න නොදනිති. ඔවුන්ගේ අත්දැකීම් ගැන කතා කිරීමට ඔවුන් ලැජ්ජා විය හැකි සේම බිය විය ද හැකිය. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන්ට සහාය සහ සම්පත් ලබා දීම සඳහා විශේෂිත ස්ථාන තිබේ නම්, ඔවුන්ගේ ගැටළු වාර්තා කිරීමට සහ ඒවා විසඳීමට සුදුසු සහය ලබා ගැනීමට ඔවුන්ට විශ්වාසයක් ඇති වීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇත. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන් සඳහා වන 'එක්-නැවතුම් මධ්‍යස්ථාන (One-stop centres)' ලොව පුරා රටවල් ගණනාවක ක්‍රියාත්මක වන අතර ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන්ට අවශ්‍ය පැමිණිලි පොලිසිය වෙත ඉදිරිපත් කිරීම; වෛද්‍ය ප්‍රතිකාර හා උපදේශනය ලබා ගැනීම; සහ එකී සිදුවීම් සම්බන්ධයෙන් ඉදිරියට ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ නීති ආධාර ලබා ගැනීම ආදී පහසුකම් ඒවා මඟින් ලැබේ.[61] පීඩාවට පත් වූ තැනැත්තන්ව ඔවුන්ගේ අපයෝජකයන්ගෙන් ආරක්ෂා කළ හැකි අයුරින් මෙකී සියල්ල ආරක්ෂිත පරිසරයක සැපයිය හැකි වේ.

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ බවට සැක කෙරෙන තැනැත්තකු ප්‍රතිකාර ලබා ගැනීමට අපේක්ෂාවෙන් රෝහලකට පැමිණි විට, එවන් තැනැත්තන් මෙකී මධ්‍යස්ථාන වෙත යොමු කළ හැකි අතර, එහිදී ඔවුන්ට උපදේශකයෙකුගෙන් උපදෙස් ලබා ගත හැකි අතර, සිදුවී ඇති දේ වාර්තා කිරීමට ඔවුන්ට ආරක්ෂිත ඉඩ ප්‍රස්ථාවක් ලබා දේ. පීඩාවට පත් වූ තැනැත්තාට අවශ්‍ය සියලු පහසුකම් එක ස්ථානයකින් ලබා දීමෙන්, එකී තැනැත්තාට අවශ්‍ය තොරතුරු සම්බන්ධයෙන් විමසීමට හෝ අවශය සම්පත් සඳහා ප්‍රවේශ වීමට තැනින් තැනට යාමේ කරදරයට මුහුණ දීමට අදාල පීඩාවට පත් වූ තැනැත්තාට සිදු නොවන අතර

60 'ශ්‍රී ලංකාවේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය', සාකච්ඡා පත්‍රය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය , 2020 සැප්තැම්බර්, https://www.cpalanka.org/wp-content/uploads/2020/09/Discussion-Paper-Right-to-Privacy-updated-draft-4-1.pdf

61 මැලේසියාව, දකුණු කොරියාව, ඉන්දියාව ඇතුළු රටවල් ගණනාවක් එවැනි මධ්‍යස්ථාන පිහිටුවා ඇත. වැඩි විස්තර සඳහා බලන්න: අයේෂා අෂ්රෆ්, සෙබස්තියන් ගාලුගිලෝස් ඇගුර්ටෝ, ෆ්‍රෙඩ්රික් ගයර් සහ වෙනත් අය, ලිංගික හිංසනයට නීති බලාත්මක කිරීමේ වින්දිත-කේන්ද්‍රීය ප්‍රතිචාර වැඩි දියුණු කිරීම, ගෝලීය හොඳම පුහුණුවීම් නාමාවලිය, CUNY අධ්‍යයන කටයුතු, 2019, https://academicworks.cuny.edu/jj_pubs/321/

ඔවුන්ගේ පෞද්ගලිකත්වය සහතික කිරීමට එය ද උපකාරී වේ. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයෙහි ගොදුරක් බවට පත් වූ තැනැත්තකු සඳහා අවශ්‍ය විවිධ සේවාවන් (සෞඛ්‍යය, නවාතැන්, නීති සේවා සහ මූල්‍ය ආධාර යන ක්ෂේත්‍රයන්හි විහිදේ) සහ ශ්‍රී ලංකාව තුළ එවැනි සේවාවන් ඔවුන්ට තනිවම ලබා ගැනීමේ දුෂ්කරතාවය හේතුවෙන් මෙය ඔවුන්ට විශේෂයෙන් වැදගත් වේ. සංකීර්ණ නොවූ ක්‍රියාවලියක් ස්වභාවිකවම අපරාධවලට ගොදුරු වූවන් බියට පත්වීම අවම මට්ටමකට පත් කරයි.

ඉහත කී තත්වය ලඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ උත්සාහ කළ ව්‍යාපෘති දෙකක් තිබේ. එයින් පළමුවැන්න වන්නේ සමහර රෝහල් සහ වෛද්‍ය සායනයන්හි හඳුන්වාදෙන ලද ***ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය*** සම්බන්ධයෙන් වන විශේෂ කවුළුවයි. මෙම විශේෂ කවුළුව මගින් සපයනු ලබන සේවාවන් අතරට උපකාරක සවන්දීම සහ රෝහලේ වල අවශ්‍ය වෙනත් සායන හෝ සේවාවන් වෙත යොමු කිරීම ඇතුළත් වේ.[62] මේ වන විට රට තුළ එවැනි සේවා කවුළු 27 ක් ඇති බව වාර්තා වන නමුත් බොහෝ රෝහල්වල වින්දිතයින් යොමු කළ හැකි උපදේශන සේවාවන් ලබා නොදෙන හෙයින්, මෙම සේවා සැපයීම රාජ්‍ය නොවන සංවිධානවල සහාය මත රඳා පවතී.[63]

වර්ෂ 2009 දී අවම වශයෙන් කාන්තාවන් 3,000 ක් වත් ප්‍රවේශ වී ඇති බව පැවසුවද, මෙම කවුළුවල සාර්ථකත්වය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත නොහැක.[64] මෙම රෝහල්වල කාර්ය මණ්ඩලයේ අවම සහයෝගය හා ඍණාත්මක ආකල්ප පැවතීම මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ මෙකී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් වන විශේෂ කවුළු වල සාර්ථකත්වයට බාධාවක් වන සාධක වශයෙන් බලපාන බවට වාර්තා වේ.[65]

රජය විසින් ගන්නා ලද දෙවන පියවර වන්නේ රෝහල්වල පිහිටුවා ඇති ***'මිතුරු පියස' සේවා ස්ථාන*** ස්ථාපිත කිරීමයි. මෙහිදී පීඩාවට පත් වූ තැනැත්තාට වෛද්‍යවරයකු හෝ හෙදියක් සමඟ මූලික සංවාදයක් පැවැත්වීමේ හැකියාව ලැබෙන අතර, පසුව ඔවුන් විසින් අදාල පීඩාවට පත් වූ තැනැත්තා නේවාසික රෝහල් සේවයට හෝ රෝහලෙන් පිටත ඇති අදාල සේවා ව්‍යුහයන්ට යොමු කරනු ඇත.[66] රෝහලෙන් පිටත ඇති අදාල සේවා ව්‍යුහයන්ට යොමු කිරීම් සඳහා ඇති විකල්පය ඔස්සේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් වන කවුළුවට වඩා එය පුළුල් වූ යාන්ත්‍රණයක් බවට පත් කරයි. රෝහලෙන් පිටත ඇති අදාල සේවා ව්‍යුහයන්ට යොමු කිරීම් සඳහා ඇති සේවාවන් අතරට දේශීය රාජ්‍ය නොවන සංවිධාන මඟින් පහසුකම් සපයනු ලබන කෙටිකාලීන නිවාස, උපදේශන හෝ නීති හා මූල්‍ය ආධාර ලබා දීම ආදී තත්වයන් පවා ඇතුළත් විය හැකිය.[67]

වර්ෂ 2015 වන විට මිතුරු පියස මධ්‍යස්ථාන 35 ක් ක්‍රියාත්මක වූ බව සෞඛ්‍ය අමාත්‍යාංශය වාර්තා මඟින් පෙන්වා දෙනු ලබන අතර වර්ෂ 2017 වන විට රාජ්‍ය අංශයේ සෞඛ්‍ය පහසුකම්වලින් 50% කට

---

[62] සෙපාලි ගුරුගේ, වත්සලා ජයසූරිය-ඉලේසිංහ සහ නාලිකා ගුණවර්ධන, 'සමීප සහකරු ප්‍රචණ්ඩත්වයට ශ්‍රී ලංකා සෞඛ්‍ය අංශයේ ප්‍රතිචාරය පිළිබඳ සමාලෝචනයක්: ආපසු හැරී බැලීම, ඉදිරියට යාම', ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියා මහජන සෞඛ්‍ය සඟරාව, 2015 ජනවාරි-ජූනි, 4 ( 1), පි. 8-9, ලබා ගත හැකිය https://apps.who.int/iris/bitstream/handle/10665/329667/seajphv4n1p6.pdf?sequence=1&isAllowed=y

[63] ඉහත එම

[64] ඉහත එම

[65] ඉහත එම

[66] ඉහත එම

[67] ඉහත එම

'ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ප්‍රචණ්ඩත්වයට ලක් වූවන්ට අනුග්‍රහය දැක්වීම' සඳහා පහසුකම් ඇති බව වාර්තා වේ.[68] මෙයට රාජ්‍ය තෘතියික සත්කාර රෝහල්වලින් 71% ක් සහ රජයේ ද්විතීයික සත්කාර රෝහල් වලින් 41% ක් ඇතුළත් වූ නමුත් මහජන ප්‍රාථමික සත්කාර පහසුකම් හෝ මහජන සායන අන්තර්ගතව නොමැත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ප්‍රචණ්ඩත්වයට ලක් වූ තැනැත්තන් මූලික වශයෙන් හමුවීමේ හැකියාව ප්‍රාථමික සත්කාරක පහසුකම් සහ මහජන සායනවල වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා ඇති හෙයින් එවන් අවස්ථාවන්හි දී ඔවුන්ව මෙම මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම වැදගත්ය.

මෙම පද්ධති හුදෙක් ස්ථාපිත කිරීම පමණක් නොව, ඒවායින් අපේක්ෂිත සේවාවන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවැසි කටයුතු කිරීම ද ඉතා වැදගත් ය. මෙම යාන්ත්‍රණයේ ඵලදායීතාවය පිළිබඳව කිසිදු අධ්‍යයනයක් මේවනතෙක් සිදුකර නොමැති වුව ද, එමගින් සැලැසෙන උපදේශන සේවා පහසුකම් අවම මට්ටමක පවතින බවට වාර්තා වේ.[69] පීඩාවට පත් වූ තැනැත්තන්ට අනවශ්‍ය අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වීම වළක්වා ගැනීම සඳහා මෙම මධ්‍යස්ථාන සහ ඔවුන් රෝහලෙන් පිටත ඇති අදාල සේවා ව්‍යුහයන්ට යොමු කරන සංවිධාන සහ ආයතන අතර නිසි සහයෝගීතාවයක් ඇති බව සහතික කිරීම ද වැදගත්ය. ශ්‍රී ලංකා ආණ්ඩු වල සහ කලින් කලට පැවත එන පරිපාලන ව්‍යුහයන්හි අඛණ්ඩව පවතින රාජ්‍ය නොවන සංවිධාන විරෝධී ආකල්පය හරහා, එවැනි වැදගත් සේවාවන් සැපයීම සඳහා පවතින සංවිධාන රජය සමඟ මැදිහත් වී කටයුතු කිරීමට බාධාවක් විය හැකි අතර, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන් විසින් එවැනි සංවිධානවලින් සේවා ලබා ගැනීමට ඉදිරිපත් වීම ද අධෛර්යමත් කළ හැකිය.

මෙම පවතින සේවාවන් මගින් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන්ට නීති ආධාර ලබා නොදේ. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන් බොහෝ විට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව නොදන්නා අතර, ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ එවන් තැනැත්තකුට නීතිඥයෙකුගේ සහාය නොමැතිව කටයුතු කිරීම අතිශයින් දුෂ්කර විය හැකිය. අනෙකුත් සියලුම අපරාධ නඩු කටයුතු වලදී මෙන්, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට අදාල සිදුවීම් සම්බන්ධයෙන් ද, වැරදිකරුවන් නීතිය හමුවට පමුණුවාලීමේ රජයේ ලැදියාව නියෝජනය කරනු ලබන නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු පවරනු ලැබේ.[70] පැමිණිල්ල මෙහෙයවන අභිචෝදක පාර්ශවය කිසිවිටෙකත් පීඩාවට පත්වන තැනැත්තා සමග සම්බන්ධතාවයක් නොමැති අතර

---

68 "සේවා ලබා ගැනීමේ හැකියාව සහ සූදානම තක්සේරු කිරීම ශ්‍රී ලංකාව - 2017", සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගෝලීය අරමුදල සමඟ එක්ව ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියා කුලිසා කළමනාකරණය සේවා, 2018, 87 වන පිටුව, ලබා ගත හැකිය http://www.health.gov.lk/moh_final/english/public/elfinder/files/publications/2019/SARASriLanka2017REPORT. pdf

69 මැනුවෙලා කොලොම්බිනි, සුසන්නා එච් මේයූ, රග්න්හයිල්ඩ් ලුන්ඩ් සහ වෙනත් අය, 'ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි හිංසනය සඳහා දේශපාලන ප්‍රමුඛතා සකස් කරන සාධක' BMC ජාත්‍යන්තර සෞඛ්‍ය හා මානව හිමිකම් (2018) 18:22, 8 වන පිටුව, ලබා ගත හැකිය https://link.springer.com/article/10.1186/s12914-018-0161-7

70 'ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුව ගැන නැවත සිතීම: ප්‍රතිසංස්කරණ සඳහා අදහස්', විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්, 9 වන පිටුව, https://www.cpalanka.org/wp-content/uploads/2020/11/AGs-Dept-Final.pdf

බොහෝ අවස්ථාවලදී පීඩාවට පත්වන තැනැත්තාගෙන් අධිකරණයෙහි අදාල ප්‍රශ්ණය විභාග කිරීමේදී හැරෙන්නට ඔවුන් සමග කිසි විටෙකත් සම්බන්ධ නොවනු ඇත.

මෙම ක්‍රියාවලියේදී පීඩාවට පත්වන තැනැත්තාට ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පැමිණිල්ල මෙහෙයවනු ලබන පාර්ශවයෙන් විමසීමට නොහැකි වන අතර, එවැනි උපදේශනයක් අවශ්‍ය නම් ඒ සඳහා පෞද්ගලික නීතිඥයෙකුට මුදල් ගෙවා ලබා ගැනීමට සිදුවේ. නීතිඥයෙකුට නොමිලේ ප්‍රවේශ වීමට ඉඩ ප්‍රස්ථාවක් ඇත්නම් ඉන් අදහස් වන්නේ පීඩාවට පත්වන තැනැත්තන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම සඳහා වඩාත් ක්‍රියාශීලීව කටයුතු කළ හැකි බවයි.

## පැමිණිලි කිරීමේ දුෂ්කරතා

වර්තමානයේදී, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන්ට පහසුවෙන් සහ විචක්ෂණ නුවණින් යුතුව පැමිණිලි කිරීම දුෂ්කර ය. පීඩාවට පත්වන තැනැත්තකු විසින් පොලිස් ස්ථානයකට පැමිණ පැමිණිල්ල කළ යුතුය. පීඩාවට පත්වන තැනැත්තකු වරදකරුගේ භාරකාරත්වයෙහි හෝ පාලනය යටතේ සිටින විට, එසේ පැමිණිලි කිරීම තවදුරටත් අභියෝගාත්මක ක්‍රියාවක් විය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වන තැනැත්තන් බොහෝ දෙනෙක් පැමිණිලි කිරීමෙන් වලක්වනු ලැබිය හැකිය. එබැවින්, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට අදාල සිදුවීම් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා වඩාත් දුරස්ථ හා ආරක්ෂිත ක්‍රම ස්ථාපිත කිරීම ඔස්සේ එවන් පැමිණිලි වැඩි වශයෙන් වාර්තා කිරීමට ඉඩ ප්‍රස්ථාවක් ලබා දේ.

ජනාධිපති රාජපක්ෂගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් කාන්තාවන්ට ඔවුන්ගේ ජංගම දුරකථන ඔස්සේ ළඟම ඇති පොලිස් ස්ථානයට ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් පිළිබඳ වාර්තා කිරීමට ඉඩ ලබා දීමට කැපවී සිටින බව පෙන්වා දී තිබේ.[71] එවැනි විධිවිධානයක් කාන්තාවන්ගේ පවුලේ සමීප සාමාජිකයන් හෝ ඔවුන් කෙරෙහි පාලනයක් ඇති පුද්ගලයන් විසින් කරනු ලබන ක්‍රියා හේතුවෙන් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට අදාල සිදුවීම් වලට මුහුණ දෙන කාන්තාවන්ට අදාල අපයෝජකයන්ගේ බලපෑමකින් තොරව ස්වකීය පීඩාව සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා බලධාරීන් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකිය.

කෙසේ වෙතත්, මෙම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේදී, පීඩාවට පත්වන තැනැත්තන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබීම වැදගත් වන අතර, එමගින් ලබා දී ඇති තොරතුරු වින්දිතයාට පවතින තත්වයට වඩා වැඩි අවදානමක් ඇති කිරීමට භාවිතා කළ නොහැකි අයුරින් සුරක්ෂිත විය යුතුවේ.

[71] ඉහත එම, 'සමෘද්ධිය හා තේජස පිළිබඳ දර්ශන', ගෝඨාභය රාජපක්ෂගේ ප්‍රකාශනය.

## 3. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආශ්‍රිත නෛතික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ මන්දගාමී වීමට බලපාන සාධක

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට අදාල ක්ෂේත්‍රයේ නීතිමය හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ප්‍රමාද වීමට හේතු ගණනාවක් වාර්තාවෙහි මෙම කොටස ඔස්සේ සමාලෝචනය කරනු ලැබේ. මෙම හේතු ශ්‍රී ලංකා සමාජය තුළින් වඩාත් සාමාන්‍යයෙන් පැන නගින ඒවා වන අතර අදාල කේෂ්ත්‍රයෙහි ප්‍රගමණය සඳහා වඩාත් පුළුල් පරාසයක පැතිරුණු බාධක පවතී.

### ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය ආශ්‍රිත ගැටළු විසඳීමට දේශපාලන අභිප්‍රායක් නොමැති වීම

වර්ෂ 1998 සිට දණ්ඩ නීති සංග්‍රහයේ ලිංගික අපරාධ සැලකිය යුතු ලෙස සංශෝධනය කර නොමැති අතර, එවක සිට බලන කල ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිව් වතාවක් සැලකිය යුතු ලෙස සංශෝධනය කර තිබේ.[72] එනම්, මෙයින් පෙනී යන්නේ අතර ඉන් ගම්‍ය වන්නේ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට අදාල ගැටළු විසඳීම සඳහා අවැසි නෛතික ප්‍රතිසංස්කරණ උදෙසා ප්‍රමුඛතාවයක් ලබා දීමට දේශපාලනික අභිප්‍රායක් නොමැති බවයි.

අදාල නීති ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කරන බවට රජය වරින් වර අදහස් ඉදිරිපත් කර ඇතත් එය කිසි විටෙකත් එපරිද්දෙන් ක්‍රියාවට නංවා නොමැත. අධිකරණ අමාත්‍යාංශය විසින් වර්ෂ 2017 දී නිකුත් කල ස්වකීය කාර්යසාධන වාර්තාවේ සඳහන් කර ඇත්තේ කාන්තාවකට නීත්‍යානුකූලව ගබ්සාවක් කළ හැකි අවස්ථා දීර්ඝ කිරීමටත්, වෛවාහක ස්ත්‍රී දූෂණය සහ දරුණු අශෝභන ක්‍රියා පිළිබඳ නීති සංශෝධනය කිරීමටත් පනත් කෙටුම්පත් යෝජනා කර ඇති බවයි.[73] වර්ෂ 2018 ට අදාල කාර්යසාධන වාර්තාව ඔස්සේ ද එම යෝජිත පනත් කෙටුම්පත් ලැයිස්තුගත කරන ලදි.[74] එහෙත් මෙම ප්‍රතිපත්ති සහ පනත් කෙටුම්පත් කිසි විටෙකත් ක්‍රියාත්මක නොවීය.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව විසින් ද මේ සම්බන්ධයෙන් නීති සහ ප්‍රතිපත්ති ගණනාවක් යෝජනා කර ඇත. වර්ෂ 2009 දී ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් වන නීතියට යෝජිත සංශෝධන;[75] වර්ෂ 2013 දී ගබ්සාව සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා;[76] වර්ෂ 2014 දී ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සඳහා දඬුවම් නියම කිරීමට අදාල මාර්ගෝපදේශයන් පිළිබඳ පැහැදිලි

---

[72] 2001 දී දහහත්වන ව්‍යවස්ථා සංශෝධනය, 2010 දී දහඅටවන ව්‍යවස්ථා සංශෝධනය, 2015 දී දහනව වන ව්‍යවස්ථා සංශෝධනය සහ 2020 දී විසිවන ව්‍යවස්ථා සංශෝධනය.

[73] අධිකරණ අමාත්‍යාංශය, 2017 කාර්ය සාධන වාර්තාව, 16 පිටුව, ලබා ගත හැකිය https://www.moj.gov.lk/web/images/pdf/progress_report/14.11.2017/English.pdf

[74] අධිකරණ අමාත්‍යාංශය, 2018 කාර්ය සාධන වාර්තාව, පි 20, ලබා ගත හැකිය https://www.moj.gov.lk/web/images/pdf/progress_report/2018/English.pdf

[75] ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව, වයස අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකු දූෂණය කිරීමේ දඬුවම - 2009 දණ්ඩ නීති සංග්‍රහයේ 364 (2) වගන්තිය සංශෝධනය කිරීම, http://lawcom.gov.lk/web/images/stories/reports/punishment_for_rape_of_a_girl_under_16_years_of_age.pdf

[76] ස්ත්‍රී දූෂණ, ව්‍යභිචාරය සහ සංජානනීය අසාමාන්‍යතා සඳහා ගැබ් ගැනීම අවසන් කිරීම තහනම් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 306 වන වගන්තිය සංශෝධනය කිරීමට ශ්‍රී ලංකාවේ නීති කොමිසම 2013 දී ලබා ගත හැකිය. http://lawcom.gov.lk/web/images/stories/reports/medical_termination_of_pregnancy_proposals_of_the_law_commi ssion_of_sri_lanka.pdf

කිරීමේ සටහනක්;[77] සහ පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීමේ සාපරාධී කරුණු පිළිබඳ යෝජිත පනත් කෙටුම්පතක් පිළිබඳ අදහස් දැක්වීම, සහ 2015 දී පෞද්ගලිකත්වය උල්ලංඝණය කිරීම සහ රහස්‍ය ඡායාරූප සංසරණය කිරීම සම්බන්ධ වරදක් යෝජනා කළ 'පුද්ගලිකත්වය උල්ලංඝනය කිරීමේ අපරාධ පැතිකඩ[78] පිළිබඳ යෝජිත පනත් කෙටුම්පතක් පිළිබඳ අදහස් දැක්වීම ආදිය එකී යෝජනාවන්ට ඇතුළත් වේ.[79] කෙසේ නමුත්, මෙම යෝජනා කිසිවක් මේ වන තෙක් නීතියක් වශයෙන් සම්මත කර නැති සේම අවම වශයෙන් පනත් කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර හෝ නොමැත.

වර්ෂ 2014 දී එවකට විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ විසින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම පිළිබඳ වාර්තාවක් සකස් කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රමුඛ පෙළේ විද්වතුන් සහ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකුගෙන් සමන්විත කොමිසමක් කැඳවන ලදී. මෙම කොමිසම මඟින් ප්‍රතිසංස්කරණ සඳහා පැහැදිලි නිර්දේශ සහිත පුළුල් වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.[80] ඉන් පසුව වික්‍රමසිංහ වර්ෂ 2015 දී අගමැති ධුරයට පත්වූ අතර වර්ෂ 2019 වන තෙක්ම එකී තනතුරෙහි කටයුතු කරන ලදි. කෙසේ වෙතත්, ඔහු විසින්ම පත් කරන ලද කොමිසම හරහා නිර්දේශ ලබාගත් ප්‍රතිසංස්කරණ කිසිවක් එම කාල පරාසය තුළ නීතිගත කර නොමැත. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත නීති ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛතාවය දීමට දේශපාලන ක්ෂේත්‍රයෙහි සෑම අංශයකම දේශපාලන නායකයින් අපොහොසත් වී ඇති ආකාරය පිළිබඳ මෙය එක් උදාහරණයක් පමණි.

## පාර්ලිමේන්තුවේ දුර්වල කාන්තා නියෝජනය

අන්තර්ජාතික වශයෙන් ඇති ශාස්ත්‍රීය ග්‍රන්ත වලට අනුව බලන කල කාන්තා ව්‍යවස්ථාදා සම්පාදකයන් ස්ත්‍රී පුරුෂ භාවය හා පාර්ලිමේන්තුවේ දී කාන්තාවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධ තත්වයන් ඉස්මතු කිරීමට වැඩි නැඹුරුතාවයක් පෙන්වා ඇත.[81] සෙසු කාන්තාවන් මුහුණ දෙන ගැටලු තේරුම් ගැනීමට හා මෙම ගැටළු වල බරපතලකම අවබෝධ කර ගැනීමට එකී කාන්තාවන්ට වැඩි ඉඩක් ඇති බැවින් මෙම තත්වය අවබෝධ කරගැනීම දුෂ්කර නොවේ.

---

[77] ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව, ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ හා ඒ හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් දඬුවම් නියම කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ පැහැදිලි සටහනක් 2014 දී ලබා ගත හැකිය. https://lawcom.gov.lk/web/images/stories/reports/explanatory_note_on_the_sentencing_policy.pdf

[78] ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව, පෞද්ගලිකත්වය උල්ලංඝනය කරන තත්වයන් යටතේ යෝජිත වැරදි, 2015

http://lawcom.gov.lk/web/images/stories/reports/2015/Explanatory_Comments_to_the_Proposed_Bill.pdf

[79] http://lawcom.gov.lk/web/images/stories/reports/2015/Proposed_Bill_Sections_1_2_3_4_and_5_Social_Media.pdf ලබා ගත හැකිය

[80] ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ විපක්ෂයේ කොමිෂන් සභාවේ නායකයා සහ ගැහැණු ළමයා වන අයිබීඩ්, ලබා ගත හැකිය http://gbvforum.lk/r-library/document/Report%20of%20the%20Leader.pdf

[81] එලිසබෙත් අසිඩු, ක්ලෙයාර් බ්‍රැන්ස්ටෙට්, නීපා ගයික්වාඩ්-බාබුලාල් සහ නනිවාසෝ මැලෝකෙල්, 'පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනයෙහි බලපෑම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්ති සම්මත වීම', JEL K38, O1, O55, https://www.aeaweb.org/conference/2018/preliminary/paper/an5yEb5h

ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය තුළ කාන්තා නියෝජනයේ දැඩි හිඟයක් පවතී. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52% ක් සහ එහි ඡන්දදායකයින්ගෙන් 56% ක් පමණ කාන්තාවන් වන නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් කාන්තාවන් සිටින්නේ 5.3% ක් පමණි.[82]

වර්ෂ 2015 මහ මැතිවරණයේදී කාන්තාවන් 13 දෙනෙකු පාර්ලිමේන්තු ආසන (ජාතික ලැයිස්තු ආසන දෙකක් ද ඇතුළුව) ලබා ගත් අතර ඔවුන් අතරින් එක් අයෙකු පසුව නුසුදුස්සකු විය. වර්ෂ 2020 දී පාර්ලිමේන්තුවේ ආසන හිමි කර ගන්නා ලද්දේ කාන්තාවන් 12 දෙනෙකු පමණි (ජාතික ලැයිස්තු ආසන 4 ක් ද ඇතුළුව).[83] මෙයින් පෙනී යන්නේ පසුගිය වසර පහක කාලය තුළ කාන්තා නියෝජනයෙහි කිසිදු ප්‍රගතියක් නොමැති බවයි.

දේශපාලනයේ කාන්තා නියෝජනයෙහි අප්‍රමාණවත් බව සඳහා හේතු ගණනාවක් ඉදිරිපත් කළ හැකිය:[84]

- කාන්තාවන්ට නාමයෝජනා ලබා දීමට දේශපාලන පක්ෂ දක්වන අකැමැත්ත.[85] මෙම තත්වය මෑතකදී නිමාවට පත් වූ වර්ෂ 2020 පාර්ලිමේන්තු මැතිවරණයෙන් ද පැහැදිලි වූ අතර එහි දී ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා ලබා දෙන ලද කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉතාම අවම මට්ටමක පැවතුණි.[86] කාන්තාවන්ට තම පවුල් තුළ දේශපාලන සබඳතා නොමැති නම් හෝ වෙනත් වේදිකාවලින් ප්‍රසිද්ධියට පත් නොවන්නේ නම්, ඔවුන් ඡන්ද ලබා ගැනීමේ හැකියාව ඇති කාන්තාවන් ලෙසට දේශපාලන පක්ෂ විසින් හඳුනාගනු නොලබන අතර, එබැවින් ඔවුන්ට නාම යෝජනා නොදීමට තීරණය කරයි.[87]

- සංස්කෘතික වශයෙන් ගත්කල, දේශපාලනය වූ කලී පිරිමින් සඳහා පමණක් වෙන් වූ විෂය ක්ෂේත්‍රයක් ලෙස ද, කාන්තාවන්ගේ භූමිකාවන් වූ කලී භාර්යාවන්, මව්වරුන් සහ ගෘහණියන් වශයෙන් ද සලකනු ලැබීම දැකිය හැකිය. මෙම ඒකාකෘතික සාම්ප්‍රදායික මතය ළමා කාලයේ

---

82 මෙත්මාලි දිසානායක, 'ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වය', සිලෝන් ටුඩේ, 2019 නොවැම්බර් 4, https://archive.ceylontoday.lk/print-more/44246

83 සාරා හැනන්, 'කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය: නිවස තුළ නැත', 2020 අගෝස්තු 16, සන්ඩේ මෝනිං, ලබා ගත හැකිය http://www.themorning.lk/female-members-of-parliament-gender-equality-not-in-the-house/

84 දේශපාලනය තුළ කාන්තා නියෝජනයක් නොමැතිකම පිළිබඳ පුළුල් අධ්‍යයනයක් මෙතැනින් සොයාගත හැකිය: චූලනී කොඩිකර, 'ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සමාන දේශපාලන නියෝජනය සඳහා අරගලය - ළමා සංවර්ධන හා කාන්තා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය සහ එක්සත් ජනපදය සඳහා කොටස් ලබා ගැනීමේ වාර්තාවක් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, 2009 ඔක්තෝබර්, ලබා ගත හැකිය https://www.undp.org/content/dam/srilanka/docs/governance/WPE%20FINAL%20PDF.pdf

85 චූලනී කොඩිකාර, 'ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ දේශපාලනය: අර්ථවත් සහභාගීත්වයට ඇති අභියෝග', ග්‍රවුන්ඩ්විව්ස්, 2008 පෙබරවාරි 9, http://groundviews.org/2008/09/02/women-and-politics-in-sri-lanka-thechallenges-to-meaningful-participation/

86 තරුමලී සිල්වා, 'කාන්තා නාමයෝජනා: ශ්‍රී ලංකාවේ මැතිවරණයට පෙරාතුව ප්‍රධාන පක්ෂවලින් දුර්වල ලෙස පෙන්වීම', 2020 ජූලි 24, ඉකොනොමික්නෙක්ස්ට්, https://economynext.com/women-nominees-poor-showing-from-majorparties-in-run-up-to-sri-lankas-polls-72327/

87 ඩේසි පෙරී, 'කාන්තා නියෝජනය සහ විධිමත් දේශපාලනයට සහභාගී වීම', භූ දර්ශන, 2018 ඔක්තෝබර් 6, ලබා ගත හැකිය https://groundviews.org/2018/06/10/womens-representation-and-participation-in-formal-politics/

සිටම පැවතීම නිසා දේශපාලනයට සහභාගී වීම පිළිබඳව කාන්තාවන් සතුව ඇත්තේ අඩු ලැදියාවක් සහ අවම කැමැත්තකි.[88]

- දේශපාලනයට පිවිසෙන කාන්තාවන් සඳහා පවුල්වල සහයෝගය නොමැතිකම සහ කාන්තාවන්ට ඒ සඳහා ඇති සම්පත් හිඟකම.[89]

- කාන්තා අපේක්ෂකයින්ට ඡන්දය දීමට ඡන්ද දායකයින් කැමත්තක් නොදැක්වීම. නිදසුනක් වශයෙන්, වර්ෂ 2020 මහ මැතිවරණයේදී, ප්‍රමුඛ දේශපාලන පක්ෂ වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ සමගි ජන බලවේගය කොළඹ දිස්ත්‍රික්කය[90] සඳහා එක් කාන්තාව බැගින් නම් කර තිබූ අතර, ඔවුන්ගෙන් කිසිවෙකුටත් පාර්ලිමේන්තුවෙහි ආසනයක් දිනා ගැනීමට ප්‍රමාණවත් මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීමට නොහැකි විය.[91] කෙසේ නමුත්, එකී දේශපාලන පක්ෂ ද්විත්වයෙහි පිරිමින් අපේක්ෂකයන් 18 දෙනෙකු කොළඹ දිස්ත්‍රික්කයේ ආසන ලබා ගැනීමට සමත් විය.

## විධායකය තුළ කාන්තාවන්ගේ ගැටළු සඳහා ලබා දී ඇති අවම ප්‍රමුඛතාවය

ජාත්‍යන්තර කාන්තා දිනය සඳහා වූ ස්වකීය පණිවුඩයේ දී ජනාධිපති රාජපක්ෂ විසින් *'ජාතියක් වශයෙන් අපි අපේ කාන්තාවන්ට ආචාර කරමු. සංවර්ධිත රටවලට සමගාමීව ශ්‍රී ලංකා කාන්තාවන් සිටින සාක්ෂරතා අනුපාතය, සමාජ අන්තර්කරණය සහ ආයු අපේක්ෂාව වැනි සමාජ දර්ශකයන් විසින් මෙය සහතික කරනු ලැබේ'*[92] යනුවෙන් ප්‍රකාශ කරන ලදි. සාක්ෂරතා අනුපාතය සහ ආයු අපේක්ෂාව වැනි සමහර සමාජ දර්ශකවල ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ තත්ත්වය ඉහළ මට්ටමක පවතින බව සත්‍යයක් වන අතර, මෙවැනි දර්ශක සහ ලෝකයේ පළමු කාන්තා අග්‍රාමාත්‍යවරියට හිමිකම් කියන ලද රට ශ්‍රී ලංකාව වැනි ඓතිහාසික සන්දිස්ථාන බොහෝ විට වර්තමානයෙහි ශ්‍රී ලංකාවේ කාන්තාවන් මුහුණ දෙන බරපතල ගැටළු සහ අසමානතාවයන් ව්‍යාකුලත්වයට පත් කිරීම සඳහා භාවිත වේ.

ශ්‍රී ලංකාවේ කාන්තාවන් සම්බන්ධයෙන් වන මෙම ඉහළ දර්ශකවලින් සමහරක් තුළින් පවා සම්පූර්ණ සත්‍ය තත්වය පිළිබිඹු නොකරයි. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලාංකික කාන්තාවන් අතර සාක්ෂරතා අනුපාතය ඉහළ මට්ටමක පැවතිය හැකි වුවද,[93] වර්ෂ 2020 දී කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය

---

88 ඉහත එම, චූලනී කොඩිකාරා, 'ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සමාන දේශපාලන නියෝජනය සඳහා අරගලය - ළමා සංවර්ධන හා කාන්තා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සඳහා කොටස් ලබා ගැනීමේ වාර්තාවක්.

89 ඉහත එම

90 නාමයෝජනා ලැයිස්තු ලබා ගත හැකිය https://cmev.files.wordpress.com/2020/06/colombo-district.pdf

91 "මහ මැතිවරණය 2020: කොළඹ දිස්ත්‍රික්කයේ වරණීය ඡන්ද", ලංකාවේ අද, 2020 අගෝස්තු 7, ලබා ගත හැකිය https://ceylontoday.lk/news/general-election-2020-preferential-votes-of-colombo-district-1

92 සම්පූර්ණ ප්‍රකාශය ලබා ගත හැකිය https://www.president.gov.lk/presidents-message-on-international-womens-day/

93 2018 දී වයස අවුරුදු 15 ත් 24 ත් අතර කාන්තාවන් අතර සාක්ෂරතා අනුපාතය 99% ක් ලෙස වාර්තා වූ අතර එය එකම වයස් කාණ්ඩයේ පිරිමින් අතර 98.5% ක් විය. කෙසේ වෙතත්, වයස අවුරුදු 65 සහ ඊට වැඩි පිරිමින් අතර සාක්ෂරතා අනුපාතය (85.1%) එම වයස් කාණ්ඩයේ කාන්තාවන්ට වඩා (74.4%) ඉහළ අගයක් ගන්නා බව වාර්තා වන අතර එය කාන්තාවන්ගේ සාක්ෂරතාවයේ වැඩි දියුණුවක් පෙන්නුම් කරයි. සංඛ්‍යාලේඛන සඳහා යුනෙස්කෝ ආයතනයේ සංඛ්‍යාලේඛන, ලබා ගත හැකිය http://uis.unesco.org/en/country/lk

වාර්තා වූයේ 34.5% ක් පමණි.[94] ආර්ථික සහභාගීත්වය සහ අවස්ථාව, අධ්‍යාපන ජයග්‍රහණය, සෞඛ්‍යය හා පැවැත්ම සහ දේශපාලන සවිබල ගැන්වීම වැනි සාධක සලකා බලනු ලබන ලෝක ආර්ථික සංසදය විසින් නිකුත් කරනු ලබන වර්ෂ 2020 සඳහා වන ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වාර්තාවට අනුව ගත් කල රටවල් 153 න් ශ්‍රී ලංකාව 102 වන ස්ථානයට[95] පත්ව ඇති අතර එමඟින් කාන්තාවන්ගේ තත්වය ඉහළ නැංවීම සඳහා රට කොතරම් දුරට ඉදිරියට යා යුතු ද යන්න මනාව පෙන්වා දේ.

වර්ෂ 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පසුව ශ්‍රී ලංකා රජයේ අමාත්‍යාංශ ප්‍රතිව්‍යුහගත කරන ලදි. වර්ෂ 1997[96] දී ප්‍රථම වරට වෙනම අමාත්‍යාංශයක් වශයෙන් පිහිටුවන ලද කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ පසුව අවස්ථා ගණනාවක දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වශයෙන් ස්ථාපිත කරන ලද අතර ඉහත පෙන්වා දුන් පරිදි අලුතින් ප්‍රතිව්‍යුහගත කරන ලද අමාත්‍යාංශ ලැයිස්තුවේ ස්ථානයක් මෙකී විෂය පථය සඳහා ලබා ගැනීමට නොහැකි විය.

කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා වන වගකීම පැහැදිලිවම පැවරී ඇති එකම අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය වන අතර ඒ යටතේ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවා ඇත. මෙම විෂය පවරන කරන ලද රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත ද සිල්වා වූ කලී පිරිමි පුද්ගලයකු වන අතර, ඔහු පළමු වරට ඇමතිවරයෙක් වූවා පමණක් නොව, ඔහු 2017 සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පමණක් කටයුතු කර ඇති පුද්ගලයෙක් පමණි.[97] මෙයට අමතරව, කැබිනට් අමාත්‍ය තනතුරු දරන 28 දෙනාගෙන් එක් කාන්තාවක් පමණක් සිටින අතර - ඒ සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි - සහ රාජ්‍ය අමාත්‍ය තනතුරු දරන 28 දෙනාගෙන් කාන්තාවන් සිටින්නේ දෙදෙනෙකු පමණි - ඒ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන්ගේ පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ සහ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍ය සීතා අරඹෙපොල.[98]

මෙම තීරණ මාලාව මඟින් පෙන්නුම් කරනු ලබන්නේ කාන්තාවන්ගේ ප්‍රගමණය වූ කලී රජයට ප්‍රමුඛතාවයක් සහිත ක්ෂේත්‍රයක් නොවන බවයි. කාන්තාවන් සුරක්ෂිත හා ඔවුන්ගේ ගෞරවය තහවුරු කරන පරිසරයක් නිර්මාණය කිරීම රජයේ කාර්යභාරයයි. මෙයට කාන්තාවන්ගේ ආරක්ෂාව සහ ගෞරවය රට තුළ බරපතල අවදානමක් ඇති බව පිළිගැනීම ඇතුළත් වේ. විධායක ආයතනවල සහ විධායක පත්වීම් යන දෙඅංශයේම රජයේ විධායක ඉහළම මට්ටම්වල කාන්තාවන්ගේ ගැටළු වලට ප්‍රමුඛතාවය ලබා දීම මෙම කාරණා නිසි අවධානයට ලක්වන බවට සහතික කිරීම සඳහා එක් ක්‍රමයක් වන අතර ඒ ඔස්සේ වඩාත් හදිසි පියවර ගත හැකිය.

94 සංඛ්‍යාලේඛන ශ්‍රී ලංකාව, ශ්‍රම බලකා සමීක්ෂණය, වාර්ෂික වාර්තාව 2019, පි. IV, ලබා ගත හැකිය http://www.statistics.gov.lk/LabourForce/StaticalInformation/AnnualReports/2019

95 ලෝක ආර්ථික සංසදය, ගෝලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වාර්තාව 2020, පිටුව 319, ලබා ගත හැකිය http://www3.weforum.org/docs/WEF_GGGR_2020.pdf

96 අමාත්‍යාංශයේ කෙටි ඉතිහාසයක් මෙහි සොයාගත හැකිය http://www.childwomenmin.gov.lk/about/overview

97 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 'ගරු. පියල් නිශාන්ත ද සිල්වා, පා.ම., ලබා ගත හැකිය https://parliament.lk/en/component/members/viewMember/3226?Itemid=206

98 'අලුතෙන් දිවුරුම් දුන් කැබිනට් මණ්ඩලය: නව මන්ත්‍රීවරුන්ට නව රජය තුළ වැඩි විධායක බලයක් ලැබේ', ඩේලි මිරර්, 2020 අගෝස්තු 13, ලබා ගත හැකිය http://www.dailymirror.lk/print/front_page/newly-sworn-Cabinet:--New-MPs-receive-moreexecutive-authority-in-new-government/238-193734

## ඍණාත්මක සමාජ ආකල්ප සහ කාන්තාවන් කෙරෙහි ඇති අපකීර්තිය

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වන නීති ප්‍රතිසංස්කරණවල මන්දගාමී ප්‍රගතියට කාන්තාවන්, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගිකත්වය සම්බන්ධයෙන් පවතින සමාජ ආකල්ප විශාල කාර්යභාරයක් ඉටු කරයි. බොහෝ විට, ශ්‍රී ලංකා සමාජයේ කාන්තාව, මව, බිරිඳ හෝ ගෘහණියකගේ භූමිකාව[99] ඉදිරිපත් කිරීමක් අපේක්ෂා කරන අතර, සාමාන්‍යයෙන් කාන්තාව යටහත් පහත්ව ස්වකීය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.[100]

කාන්තාවන්ගේ කරුණාවන්ත ස්වභාවය පවා මෙම අදහස් තවදුරටත් ශක්තිමත් කරනු ලබයි. උදාහරණයක් ලෙස ගෝඨාභය රාජපක්ෂගේ ජනාධිපති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන්නේ 'පුරවැසියන්, පවුල්, ප්‍රජාවන් සහ සමාජ හැඩගස්වා ඇත්තේ කාන්තාවන්ගේ මග පෙන්වීම හා පෝෂණය තුළින්' බවය.[101] මෙම නිර්ණායක සපුරාලන කාන්තාවක් බොහෝ විට යහපත් හා ගුණවත් කාන්තාවන් වශයෙන් හඳුනාගනු ලැබිය හැකි අතර, වෙනත් ඕනෑම විකල්ප ක්‍රමයකට කාන්තාව හඳුනාගනු ලබන්නේ නම් එහි දී ඇයව අපකීර්තියට පත්වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාන්තාවක් නිවස තුළ ඉතා යටහත් පහත් තත්වයක සිටින බවට බොහෝ දෙනා විශ්වාස කරන අතර, තම ස්වාමිපුරුෂයාට 'අකීකරු' වන කාන්තාවක් තමාට සහකරුගෙන් සිදුවන ඕනෑම හිංසනයකට යටත් වීමට සිදු වීම නිරන්තරයෙන්ම සිදුවිය හැකි බවට වන විශ්වාස පවතී.[102]

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය සිදුවන්නේ කෙසේද සහ එසේ වීමට බලපාන හේතු කවරේද යන්න පිළිබඳ ප්‍රචලිත හා භයානක වැරදි වැටහීම් සමඟ මෙය සම්බන්ධ වේ; නිදසුනක් වශයෙන්, ලිංගික අතවරයකට ලක්වූ කාන්තාවක් ඇය හැසිරෙන ආකාරය හෝ ඇඳ පැළඳ සිටි ආකාරය මත පදනම්ව 'එවන් හිංසනයක් ඉල්ලා සිටීම' ආදී වශයෙන් වූ තත්වයන් පවතී.[103] බොහෝ විට, 'එවන් හිංසනයක් ඉල්ලා සිටීම' යනුවෙන් පැහැදිලි කෙරෙන්නා වූ හැසිරීම් සම්බන්ධයෙන් අදහස් දක්වන්නන් වූ කලී කාන්තාවන් විසින් ඉටු කිරීමට අපේක්ෂා කරන භූමිකාවන්ට එකඟත්වයක් නොදක්වන ප්‍රතිවිරුද්ධ අදහස් ඇති පිරිසක් වේ.

---

99 ඉහත එම, චූලනී කොඩිකාර, 'ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සමාන දේශපාලන නියෝජනය සඳහා අරගලය - ළමා සංවර්ධන හා කාන්තා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යථා තත්වය අවබෝධ කර ගැනීමේ වාර්තාවක්'.

100 'ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ රට පැතිකඩ', ලෝක සෞඛ්‍ය සංවිධානය, 2018. ලබා ගත හැකිය https://apps.who.int/iris/handle/10665/273193

101 ඉහත එම, 'සෞභාග්‍යයේ දැක්ම', ගෝතබයා රාජපක්ෂගේ ප්‍රකාශනය

102 ඉහත එම, 'ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ රට පැතිකඩ', ලෝක සෞඛ්‍ය සංවිධානය

103 ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගික හිංසනය කෙරෙහි බලපාන සමාජ සම්මතයන් පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සොයා ගත හැකිය -අනාම් පර්වේස් බට් සහ ශාරන්යා සේකරම්, අවකාශීය පුරුෂාධිපත්‍යය බිඳ දැමීම - ශ්‍රී ලංකාවේ ඔක්ස්ෆෑම්, 2019 , ලබා ගත හැකිය https://oxfamilibrary.openrepository.com/bitstream/handle/10546/620845/smashing-spatial-patriarchy-genderbased-violence-public-transport-sri-lanka-230719-en.pdf?sequence=1&isAllowed=y&fbclid=IwAR09orrieaVNOoYjr2RXh4rurLdwvm0uyIVAfkmLBpb1s1XO4uQd36kcZQ

බොහෝ අය විශ්වාස කරනු ලබන්නේ පුරුෂයෙකු විසින් කාන්තාවක් විසින් ශරීරය යම් තරමකට නිරාවරණය වන පරිදි ඇඳුම් ඇඳ පැළඳ ගමන් කරන විට පිරිමින් එවන් වූ කාන්තාවක් ස්පර්ශ කිරීමට හෝ ලිංගික අතවර කිරීමට පෙළඹෙනු ඇති අතර, එම නිසා සංවරශීලි අන්දමට ඇඳුම් ඇඳීමෙන් ලිංගික අතවරවලින් ආරක්ෂා වීමේ වගකීම කාන්තාව මත රඳා පවතී යනුවෙනි.[104] කාන්තාවක් තනිවම ගමන් කිරීම හෝ රාත්‍රියේ ගමන් කිරීම වැනි හැසිරීම් සම්බන්ධයෙන් ද ඒ හා සමාන චර්යාත්මක සමාජ සම්මතයන් පවතී.

අපේක්ෂිත ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් ඉටු කිරීමට අපොහොසත් වීම නිසා ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය සඳහා දොස් පැවරීම වින්දිතයා මත පැවරෙන විට, අපරාධයේ සැබෑ දෝෂය වැරදිකරු සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය යන්න අර්ථවත් ලෙස ආමන්ත්‍රණය නොකරන පද්ධතිමය කාරණා යන මුඛ්‍ය සාධක ද්විත්වයම වෙනත් දිශානතියකට යොමු කෙරෙනු ලැබේ. මෙම පීතෘමූලික මනෝභාවයන් සමාජයේ අභියෝගයට ලක් නොවී පවතින තාක් කල්, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය අඛණ්ඩව පවතින හා අවධානයට ලක් නොවන ගැටලුවක් වශයෙන් බොහෝ කාලයක් පවතිනු ඇත.

මෙම ඒකාකෘති හා අපකීර්තියට ආගමික නායකයින් ද දායක වී ඇති අතර අවස්ථා කිහිපයකදීම ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත ගැටළු වලට ධනාත්මක පියවරයන් ගැනීමේ විවිධ උත්සහයන් අවහිර කර ඇත. නිදසුනක් වශයෙන්, ළමයින් සඳහා ලිංගික අධ්‍යාපනය පිළිබඳ පෙළ පොතක් ප්‍රකාශයට පත් කිරීමට ආගමික නායකයෝ විරෝධය දැක්වූහ. [105] බොහෝ අවස්ථාවන්හි දී රාජ්‍ය පාර්ශවය ද මෙවන් වූ මතයන්ට අනෙකුත් පාර්ශවකරුවන්ගේ ලැදියාවන්ට වඩා ඉහළ ප්‍රමුඛත්වය ලබාදෙන බව විද්‍යමාන වේ.

---

104 එලිසබෙත් ඩාර්ජ්, කුමුදු විජේවර්ධන, ගුනිලා ලින්ඩ්මාර්ක් සහ පියා ඇක්සෙමෝ, '' මිනිසෙකු ප්‍රධාන භූමිකාව භාර ගත්තද, ඔහුට අතවර කිරීමට අයිතියක් නැත '': ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ අනාගත පිරිමි නායකයින්ගේ අදහස්, ගෝලීය සෞඛ්‍ය ක්‍රියා 2017, 10: 1, ලබා ගත හැකිය https://doi.org/10.1080/16549716.2017.1348692

105 'මතභේදාත්මක පෙළපොත තීරණය කිරීම සඳහා විශේෂ රැස්වීමකී හතේ අපේ පොත', නිව්ස්ෆර්ස්ට්, 2020 ජනවාරි 10, https://www.newsfirst.lk/2020/01/10/special-meeting-to-decide-on-controversial-textbook-hathe-ape-potha/

## 4. නිර්දේශ

මෙම කොටසෙහි ඉදිරිපත් කරනු ලබන නිර්දේශ ප්‍රධාන කාණ්ඩ ත්‍රිත්වයකට අයත් වේ: ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධව පවත්නා නීති ප්‍රතිසංස්කරණය කිරීම අරමුණු කරගත් නිර්දේශ; අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය වඩාත් වින්දිත කේන්ද්‍රීය බවට පත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීම අරමුණු කරගත් නිර්දේශ; සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙහි ව්‍යාප්තිය අඩු කිරීම අරමුණු කරගත් නිර්දේශ ආදී වශයෙනි. මෙම නිර්දේශයන් ශ්‍රී ලංකා රජය - විශේෂයෙන් විධායක, අධිකරණ අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය මෙන්ම නීති සම්පාදකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ අදාළ ක්ෂේත්‍රයන්හි සේවය කරන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් ඉලක්ක කර ගෙන ඇත.

### ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය හා සම්බන්ධ පවත්නා නීති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ

***දණ්ඩ නීති සංග්‍රහයේ ස්ත්‍රී දූෂණ නම් අපරාධය පහත පරිදි ප්‍රතිසංස්කරණය කිරීම:***

- වරදක් කළ හැක්කේ කවරෙකුටද යන කාරණයේ දී එය පුරුෂයින් විසින් බවට ඇති විධිවිධානය ඕනෑම ලිංගයක තැනැත්තකු වශයෙන් විෂය පථය පුළුල් කිරීම.

- ඕනෑම ලිංගයක තැනැත්තන් විසින් වෙනත් ඕනෑම ලිංගයකට අයත් තැනැත්තන්ට සිදු කරන ලද මුඛ හා ගුද මාර්ගයෙන් ප්‍රවේශනය යන ක්‍රියාවන් ද ආවරණය වන පරිදි මෙම වරදෙහි විෂය පථය පුළුල් කිරීම.

- ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට වෛවාහික ස්ත්‍රී දූෂණය ද අන්තර්ගත කිරීම.

- ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයකදී වින්දිතයා කැමැත්ත ලබා දී නොමැති අවස්ථාවන්හි දී අනිවාර්ය අවම දඬුවම් නියම කිරීම.

- ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයකදී 'බාලවයස්කාර මුක්තියට' අදාළ වන අවස්ථා වලදී වින්දිතයාගේ අවම වයස ඇතුළත් කිරීම, එනම් වයස අවුරුදු 18 ට අඩු වැරදිකරුවන්ට දඬුවම අඩු කිරීම අදාළ විය යුත්තේ කැමැත්ත ලබා දුන් බාල වයස්කරු යම් නිශ්චිත වයසකට වඩා වැඩි නම් පමණක් වන අතර එකී අදාළ වයස අවුරුදු 14 ත් 15 ත් අතර වයස් සීමාවක් වීම වඩාත් සුදුසු වන්නා සේම, එය තීරණය කිරීමේ දී ව්‍යවස්ථාදා සම්පාදකයන් විසින් එම තීරණය ගනු ලැබිය යුත්තේ අදාළ සමාජ සාධක අධ්‍යයනය කිරීම මත පදනම්වය.

*2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම:*

- දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන සමඟ අන්තර් සම්බන්ධයක් නොමැති පරිදි ශාරීරික හිංසනය පිළිබඳ තනි අර්ථ දැක්වීමක් සැපයීම.

- ආර්ථික අපයෝජනය ද ඇතුළත් වන පරිදි "ගෘහස්ථ හිංසනය" පිළිබඳ පුළුල් අර්ථ දැක්වීමක් ඇතුළත් කිරීම.

- "චිත්තවේගීය අපයෝජනය" යන්නෙහි අර්ථ දැක්වීමේදී "අපයෝජන රටාවක්" යනු කුමක්ද සහ "බරපතළ ස්වභාවයක් පැවතීම" යන තත්වයන් සංයුක්ත වන ආකාරය සම්බන්ධයෙන් නිර්වචනය කිරීම.

- අගතියට පත් පුද්ගලයෙකුගේ නියෝජිතයෙක් වශයෙන් අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කර ආරක්ෂක ආඥාවක් ලබා ගැනීමේ අවස්ථාව තෙවන පාර්ශවයන්ට ලබා දීම.

- අගතියට පත් පුද්ගලයෙකුට සරල පෝරමයක් පුරවා රෝහලක, පොලිස් ස්ථානයක හෝ මහේස්ත්‍රාත් අධිකරණයකට ගොනු කිරීමෙන් ආරක්ෂණ නියෝගයක් ලබා ගැනීමට හැකිවන පරිදි 2 (3) වගන්තියේ ඇති නිශ්චිත පෝර්ම සම්පූර්ණ කිරීමේ අවශ්‍යතා ළිහිල් කිරීම.

- ගෘහස්ථ හිංසනය පිළිබඳ පැමිණිලිවලට ප්‍රමුඛතාවය ලබා දෙන බවට සහතික වීම සහ අධිකරණය විසින් ඒවා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම.

- පද්ධතියේ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා වගඋත්තරකරු වෙත කඩිනම් දැනුම් දීමේ ක්‍රියා පටිපාටියක් ඇතුළත් කිරීම.

- ගෘහස්ථ හිංසනය පිළිබඳ විධිවිධාන දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් කිරීම.

*ගබ්සාව පිළිබඳ දණ්ඩ නීති සංග්‍රහයේ ඇති විධිවිධාන සංශෝධනය කිරීම:*

- කාන්තාවගේ කැමැත්ත ලබා ගත් පසු කාන්තාවකගේ ගැබ් ගැනීමක් ගබ්සා කිරීම මඟින් අපරාධයක් සංස්ථාපනය නොවන බවට පත් කිරීම.

- කාන්තාවක් තමන් විසින්ම ගැබ් ගැනීමක් ගබ්සා කිරීම මඟින් අපරාධයක් සංස්ථාපනය නොවන බවට පත් කිරීම.

## අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය වඩාත් වින්දිත කේන්ද්‍රීය බවට පත් කිරීම සඳහා නිර්දේශ

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයින් මුහුණ දෙන කම්පනයේ දැඩි ස්වභාවය හේතුවෙන්, පීඩාවට පත් තැනැත්තාගේ තත්වය කෙරෙහි අවධානය යොමු කරමින් අදාල යුක්ති විනිශ්චය පද්ධතිය සැලසුම් ඉතා වැදගත් වේ. අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ පවතින අඩුපාඩු හේතුවෙන් අපයෝජකයින් අතින් ඒ වන විටත් පීඩාවට පත්ව ඇති කිසිදු ගොදුරක් තවදුරටත් පීඩාවට පත්විය යුතු නොවේ. යුක්තිය ඉටුකරගැනීම සඳහා අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ තුළ කටයුතු කිරීමේ දී වින්දිතයින්ගේ කම්පනය හා දුක් වේදනා අවම කිරීම සඳහා පහත සඳහන් පියවරයන් යෝජනා කෙරේ.

### (අ) නීතිපති දෙපාර්තමේන්තුව තුළ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය සම්බන්ධයෙන් විශේෂිත ඒකකයක් පිහිටුවීම

නඩු පැවරීම් සඳහා පැහැදිලි උපාය මාර්ගයක් සහිතව ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු කටයුතු කඩිනමින් නිගමනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නීතිපති දෙපාර්තමේන්තුව තුළ විශේෂිත ඒකකයක් පිහිටුවීම කළ යුතුවේ. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්ව ආශ්‍රිත සිද්ධීන් පිළිබඳ කටයුතු කිරීමේ පූර්ව අත්දැකීම් මත හෝ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූවන්ට උපකාර කිරීමට ඇති ළැදිකම සහ කැමැත්ත මත තෝරාගත් නීතිඥයින් මෙම ඒකකයට අනුයුක්ත කළයුතු වේ. පීඩාවට පත් තැනැත්තන් මුහුණ දෙන ශාරීරික හා මානසික කම්පනයන් මෙන්ම අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ ඔවුන්ට වඩාත් හොඳින් සහාය දැක්විය හැකි ආකාරය අවබෝධ කර ගැනීම සඳහා මෙම නීතිඥයින්ට අමතර පුහුණුවක් ලබා දීමට පියවර ගතයුතු වේ.

### (ආ) ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය ආශ්‍රිත නඩු විභාග කිරීම සඳහා විශේෂ මහාධිකරණ පිහිටුවීම

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත නඩු සඳහා පමණක් වෙන් වූ වෙනම මහාධිකරණ පිහිටුවීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. මෙම නඩු වලදී හැකි තාක් දුරට හා ප්‍රායෝගිකව දෛනිකව නඩු විභාග කළ යුතු අතර, මෙකී නඩු කටයුතු වලට අදාල සාක්ෂි මෙහෙයවීමට ප්‍රමුඛත්වය ලබා දී කඩිනමින් එකී කටයුතු නිමා කළ යුතුය.

### (ඇ) අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියේ ධාරිතාවය සහ ප්‍රචාරණය ඇගයීම සහ වැඩි දියුණු කිරීම

මෙකී අධිකාරියෙහි ප්‍රගමණයට බාධාවක් වී ඇති හේතු පිළිබඳව ගැඹුරු හා ස්වාධීන අධ්‍යයනයක් සිදු කිරීමට කටයුතු යෙදිය යුතු වේ. එවන් වූ අධ්‍යයනයක සොයාගැනීම් අනුව මෙකී අධිකාරිය යථා තත්වයට පත් කිරීම සහ ඒ සඳහා ප්‍රමාණවත් ලෙස අරමුදල් සැපයීම: එහි අනිවාර්ය කාර්ය කර්තව්‍යයන් ඉටු කිරීම; ප්‍රමාණවත් හා සුදුසු පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට; ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ද ඇතුළුව අපරාධවලට ගොදුරු වූ සියලු දෙනාට ඉදිරියට පැමිණිය හැකි වන පරිදි පුළුල් පරාසයකින් ඒ පිළිබඳව දැනුවත් කිරීම පිණිස ප්‍රචාරණය කිරීම.

### (ඈ) ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනයෙහි සියලුම පීඩාවට පත් වූ තැනැත්තන් සඳහා විවෘත අධිකරණයෙහි නඩු ඇසීමෙන් වැලකීසිටීමට අවස්ථාව සලසා දීම

මෙවන් නඩු කටයුතු මෙහෙය වීම සම්බන්ධයෙන් මහාධිකරණවල දැනට පවත්නා පරිචය ලිඛිත තත්වයට පත් කිරීම හෝ කිසියම් ලිංගික වරදකට ගොදුරු වූවෙකු සම්බන්ධයෙන් වන නඩු විභාග කරනු ලබන විට මහජනයා අධිකරණ කාමරයෙන් බැහැර කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී එවැනි නඩු විභාගයක් විනිසුරුවරයාගේ නිල කාර්යාලය තුළ දී පැවැත්වීමට ඉඩ දීම. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත අපරාධවලට ගොදුරු වූ සියලු දෙනා ආවරණය වන පරිදි මෙය පුළුල් කළ යුතුවේ.

### (ඉ) ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් සඳහා කැමරාවක් ඔස්සේ අධිකරණ කටයුතු කිරීමට ඉඩ දීම

ළමා අපයෝජන නඩු වලදී අවසර දී ඇති ක්‍රියා පටිපාටියට සමාන ආකාරයට අවදානමට ලක්විය හැකි වින්දිතයින් සම්බන්ධයෙන් වින්දිතයා සමඟ සම්මුඛ සාකච්ඡා වල වීඩියෝ පටිගත කිරීම් ඉදිරිපත් කිරීමට පැමිණිල්ලට අවසර දිය යුතු වේ.

### (ඊ) ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත නඩු පිළිබඳ අධිකරණ තීන්දු වලදී වින්දිතයින්ගේ නම් ප්‍රකාශයට පත් කිරීම තහනම් කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශයට පත් කිරීමේ දී වින්දිතයින්ගේ නම් ඇතුළත් කිරීම තහනම් කිරීමට පියවර ගතයුතු වේ. වින්දිතයින්ගේ නම් ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය වන අවස්ථාවන්හි දී, එවන් නඩු තීන්දු ප්‍රසිද්ධියට පත් කරනු ලබන කල්හි අදාල පුද්ගල නම් ඉවත් කිරීමට පියවර ගත යුතු වේ.

### (උ) ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත වැරදි සඳහා පැහැදිලි දඬුවම් නියම කිරීමේ මාර්ගෝපදේශයන් ස්ථාපිත කිරීම.

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත සියලු අපරාධ සඳහා දඬුවම්වල ඒකාකාරී ස්ථිර ස්වභාවය සහතික කිරීම සඳහා දඬුවම් නියම කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශයන් සංශෝධනය කිරීම මඟින් සිදුවී ඇති හානිය සහ සුදුසු ප්‍රතිකර්මයන්ට අදාල සාධක සැලකිල්ලට ගැනීම ඇතුළු සන්දර්භයට ගැළපෙන සාධක පරාසයක් තුළ අධිකරණ අභිමතය ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දේ.

### (ඌ) ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් සඳහා 'එක්-නැවතුම් මධ්‍යස්ථානය' සේවාවන් විධිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම

වර්තමානයෙහි පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ විශේෂ කවුළුව සහ 'මිතුරු පියස' සේවා ස්ථාන පිළිබඳ තත්වය අධ්‍යනය කර ඒවා සුදුසු පරිදි ඒකාබද්ධ කිරීමට කටයුතු කළයුතු වේ. එසේ ඒකාබද්ධ කරන ලද 'එක්-නැවතුම් මධ්‍යස්ථාන' සියලුම දිස්ත්‍රික්කවල සියලුම පොදු තෘතියික සත්කාර රෝහල්, මහජන ද්විතීයික සත්කාර රෝහල්, මහජන ප්‍රාථමික සත්කාර පහසුකම් සහ මහජන සායනවල ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම සඳහා අවැසි පියවර ගතයුතු වේ. ඔවුන් අවම වශයෙන් මනෝවිද්‍යාත්මක උපදේශනය, නීතිමය සහාය, පොලිස් පැමිණිලි ඉදිරිපත් කිරීමට සහාය වීම (අවශ්‍ය නම්) සහ අවම මට්ටමේ මූල්‍ය ආධාර සහ නවාතැන් පහසුකම් ආදී සේවාවන් සපයන බවට සහතික විය යුතු වේ. එකී තත්වයන් සම්බන්ධයෙන් වැඩිදුර සේවා සැපයීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීමට පියවර ගතයුතු වේ.

### (එ) ජංගම දුරකථනයෙන් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කිරීමට ඉඩ සලසන පහසුකමක් හඳුන්වා දීම

පුද්ගලිකත්වය සම්බන්ධයෙන් දැඩි ආරක්ෂාවක් සහිතව මෙම පහසුකම සැලසුම් කිරීම; එකී පහසුකම සඳහා ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දී එය නිසි ලෙස නඩත්තු කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ. මෙම සේවාව භාවිත කිරීම සඳහා ස්මාර්ට් දුරකථනයක් භාවිතා කිරීම අත්‍යාවශ්‍ය නොවිය යුතු අතර ඕනෑම

දුරකථනයක් හරහා එකී සේවාවට ප්‍රවේශ වීමේ හැකියාව පැවතිය යුතුය. වින්දිතයාගේ පෞද්ගලිකත්වය හෝ ආරක්ෂාව අවදානමට ලක් නොවන අයුරින් මෙම සේවාව ක්‍රියාත්මක කළ යුතුය.

## ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත හිංසනය ඇතිවීම අවම කිරීම සඳහා නිර්දේශ

අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියෙහි ප්‍රතිසංස්කරණයන් වැදගත් වුවත්, ශ්‍රී ලංකාවේ සිදුවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සිදුවීම් ප්‍රමාණය මැඩපැවැත්වීමට එය ප්‍රමාණවත් නොවේ. ගැටලුවට මූලික වී ඇති පදනම් හේතු සාධක ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ද ඒ හා සමගාමීව යොමු කිරීම වැදගත් ය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වලට ගොදුරු වේ යැයි බියෙන් තොරව මිනිසුන්ට ජීවත් වීමට හැකි ස්ථාපිත වන්නේ එවිට පමණි.

සරලවම කිවහොත්, නෛතික හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලින් පමණක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සමාජයෙන් මුලිනුපුටා දැමීම සිදුකළ නොහැකි වුවද, එකී ගැටලුවට අදාල එවැනි මූල හේතූන් විසඳීම සඳහා යෝජනා කරනු ලබන නිර්දේශ කිහිපයක් පහත දැක්වේ.

### *(අ) කාන්තා කටයුතු අමාත්‍යාංශයක් පිහිටුවීම*

සමාජ දර්ශකවලට අනුව කාන්තාවන්ගේ තත්වය වැඩිදියුණු කිරීම සඳහා පමණක් නොව, කාන්තාවන්ගේ අභිමානය හා ආරක්ෂාව ආරක්ෂා තහවුරු කිරීම ද අරමුණු කරගත් පද්ධතිමය ප්‍රතිසංස්කරණ කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීමට කටයුතු කළ යුතු වේ. මෙම පුළුල් වරම ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික මුදල් වෙන් කිරීම් මගින් ප්‍රමාණවත් සම්පත් අමාත්‍යාංශයට ලබා දීමට පියවර ගැනීම කළ යුතුය. කාන්තා කටයුතු අමාත්‍ය තනතුර කැබිනට් අමාත්‍ය ධුරයක් බවට පත් කිරීම කළ යුතුවේ.

### *(ආ) ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුළුල් පර්යේෂණ පැවැත්වීම*

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙහි ව්‍යාප්තිය සැබවින්ම නිශ්චය කර ගැනීම සඳහා දිවයින පුරා පුළුල් අධ්‍යයනයන් සිදු කීමට අවැසි පියවර ගත යුතු වේ. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ඇතිවීමට හේතු සහ එහි ව්‍යාප්තියේ අනුපාතයට හේතු වී ඇති ආකල්ප පිළිබඳව වැඩිදුර අධ්‍යයනයන් සිදු කිරීමට නිර්දේශ කරනු ලැබේ. පර්යේෂණ අධ්‍යනයන් මත පදනම් වූ එවැනි තොරතුරු ලබා ගත හැකි විට, මෙරටේ විශේෂිත සමාජ සන්දර්භයට සරිලන පරිදි සකස් කළ විසඳුම් ක්‍රියාත්මක කිරීමට රජයට හැකි වනු ඇත.

### *(ඇ) පාසල් විෂයමාලා යාවත්කාලීන කිරීම සහ පුළුල් ලිංගික අධ්‍යාපනයක් හඳුන්වා දීම*

විශේෂයෙන් සෞඛ්‍ය, සමාජ අධ්‍යයන සහ ජීව විද්‍යාවට අදාළ විෂයයන් තුළ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳව පවතින සාම්ප්‍රදායික ඒකාකෘතික ස්වභාවයන් ඉවත් කිරීම සඳහා සියලුම ශ්‍රේණි සඳහා සියලුම පාසල්

විෂයමාලා යාවත්කාලීන කිරීමට පියවර ගතයුතු වේ. පාසැලේ දරුවෙකුගේ අධ්‍යාපනය ලබන කාල පරාසය පුරාම ඒ ඒ වයස් මට්ටමට සරිලන පරිදි පුළුල් ලිංගික අධ්‍යාපනයක් ලබා දීමට අවැසි පියවර හඳුන්වා දීම.

පුළුල් ලිංගික අධ්‍යාපනයක් සඳහා විෂය මාලාවක් සැලසුම් කිරීමේදී සෞඛ්‍ය, මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් උපදෙස් ලබා ගනිමින් සෞඛ්‍ය සම්පන්න සහ සෞඛ්‍යයට අහිතකර ලිංගික හැසිරීම් හඳුනාගෙන විවෘතව සාකච්ඡා කළ හැකි වන පරිදි විෂය මාලාව සැකසිය යුතු අතර එහි දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සිදු නොකිරීමට වගබලා බැනීමට හැකිවන පරිදි ක්‍රියාකල යුතුය. ලිංගික අධ්‍යාපනය පිළිබඳ තොරතුරු භාෂා තුනෙන්ම පහසුවෙන් ලබා ගත හැකිවිය යුතුය.

පුළුල් ලිංගික අධ්‍යාපන කටයුතු මෙහෙයවනු ලබන ගුරුවරුන්ට අදාල විෂයමාලාව නිසි ලෙස ලබා දිය හැකි වන පරිදි නිසි පුහුණුවක් ලබා දීම, එමගින් අතර ගුරුවරුන් විසින්ම ස්ත්‍රී පුරුෂ භාවය හා ලිංගිකත්වය පිළිබඳ ඔවුනොවුන්ගේ පුද්ගලානුබද්ධ පක්ෂග්‍රාහීවත්වයන් ළමයින් මත පැටවීමකින් තොරව සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

### *(ඈ) වැරදිකරුවන් සඳහා නිසි පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම*

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ක්‍රියාවක් කර ඇති බවට සොයාගත් කිසිදු පුද්ගලයෙකු එවැනි ක්‍රියාවක් නැවත සිදු නොකිරීම තහවුරු වන පරිදි පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුවේ. මෙම වැඩසටහන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආශ්‍රිත වැරදිවලට දඬුවම් කිරීමේ කොටසක් බවට පත් කිරීම කළයුතුය. අනිවාර්ය උපදේශනය, අධ්‍යාපනය සහ අවශ්‍ය යැයි සලකන විට වැරදිකරුවන් අධීක්ෂණය කිරීම ආදී අංගයන් ඊට ඇතුළත් විය යුතුය.